# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2160/37 – 2020 ජනවාරි 30 වැනි බ්‍රහස්පතින්දා – 2020.01.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය*: IR/22/16/2005.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2019.04.03 දිනැති හා අංක 2117/32 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2019.03.26 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කුරුණෑගල, මල්කඩුවාව, බුළුගහවත්ත, 6 වන පටුමගෙහි පදිංචි පී.ඒ.ඒ.ගුණතිලක මයා සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2020.01.13 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ජනවාරි මස 27 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කොළඹ කාර්මික අධිකරණයේ දී ය.**

පී.ඒ.ඒ.ගුණතිලක,
6 වන පටුමග,
බුළුගහවත්ත,
මල්කඩුවාව,
කුරුණෑගල.

*පළමු පාර්ශවය*

IR/22/16/2005.

*බේරුම්කරණ අංකය: ඒ /36/2019.*

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

*දෙවන පාර්ශ්වය*

**අතර පවත්නා කාර්මික ආරාවුල.**

ඉදිරියේදී - බේරුම්කරු ඕබඩගේ ලීලාරත්න මැතිතුමා.

පෙනී සිටීම -

1 පාර්ශවය වෙනුවෙන් - ඉල්ලුම්කරු පී.ඒ.ඒ.ගුණතිලක මහතා

2 වන පාර්ශවය වෙනුවෙන් - සහකාර නීති නිලධාරිනී නීතිඥ දිල්රුක්ෂි ලියනගේ, රජයේ නීතිඥ මල්මී අබේසුන්දර

**බේරුම්කරණ ප්‍රදානය :**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා මා වෙත යොමුකර බේරුම්කරු වශයෙන් මා පත්කර ඇත.

එකී කාර්මික ආරාවුලට හේතු වී ඇති කරුණු සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ යොමුව පහත පරිදි වේ:

''1. 1970 ජුලි මස 02 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවයට බඳවා ගනු ලැබූ පී.ඒ.ඒ. ගුණතිලක මහතා වෙත ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ සේවක මණ්ඩල කළමණාකරු විසින් නිකුත් කරනු ලැබූ 2002.09.25 දිනැති ලිපිය අනුව එම සේවකයාගේ මුල් පත්වීම වශයෙන් සැලකිය හැකි දිනය කුමක් විය යුතුද?

2. එම මුල් පත්වීමේ දිනය අනුව පී.ඒ.ඒ.ගුණතිලක මහතා විශ්‍රාම ලැබිය යුතු වයස් සීමාව කුමක් විය යුතු ද?

3. පී.ඒ.ඒ.ගුණතිලක මහතා වයස අවුරුදු 55 සම්පූර්ණ වීම මත 2005.12.28 වැනි දින ක්‍රියාත්මක වන පරිදි සේවයෙන් විශ්‍රාම ගැන්වීමෙන් ඔහුට යම් අසාධාරණයක් සිදුවූයේ ද? අසාධාරණයක් වූයේ නම් ඔහුට ලැබිය යුතු සහන මොනවාද යන්න, හා

4. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ 2004 අංක 02 දරන මුදල් කොට්ඨාස චක්‍රලේඛය පරිදි හිඟ වැටුප් ලබා ගැනීමට පී.ඒ.ඒ.ගුණතිලක මහතා හිමිකම් ලබන්නේ ද? එසේ නම් ඔහුට ලැබිය යුතු හිඟ මුදල් ප්‍රමාණය කොපමණද යන්න පිළිබඳව වේ.''

මේ සම්බන්ධයෙන් දෙපාර්ශවයේම පළමු ප්‍රකාශ කැඳවා ඇති අතර පළමු පාර්ශවය විසින් තමන්ට සිදුවූ අසාධාරණය පිළිබඳව එනම් මීට ප්‍රථමයෙන් ද බේරුම්කරණ නඩුවක් මේ සම්බන්ධයෙන් පැවැත් වූ බව ද, එහෙත් ඒ සම්බන්ධයෙන් නිසි පරීක්ෂණයක් සිදු නොවූ බව ද, ඉන් අනතුරුව නැවතත් මෙම බේරුම්කරණ නඩුව කැඳවූ බව ද, තමන් වසර 15 කට ආසන්න කාලයක් මේ සම්බන්ධයෙන් නිකරුනේ කාලය කා දමන බව ද, පවසා ඇත.

දෙවැනි පාර්ශවය තම පළමු ප්‍රකාශය ඉදිරිපත් කරමින් මෙම ඉල්ලුම්කරු 2001.07.12 දින සිට නොදන්වා සේවයට නොපැමිණීම මත සේවය අතහැර ගියා සේ සලකා කටයුතු කර ඇති බවත්, මෙම ඉල්ලුම්කරු සිය පාරිතෝෂික මුදල් හා සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ආපසු ලබා ගනිමින් සිය සේවය අවසන් කිරීම පිළිගෙන ඇති බවත් දන්වා සිටී. පසුව ඔහු විසින් කරන ලද අභියාචනයක් සලකා බලා 2001.07.12 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි එදින සිට සේවයට වාර්තා කරන ලද දිනය දක්වා කාලය අඛණ්ඩ ලෙස සලකා ඇති නමුත් ඔහුගේ මුල් පත්වීම් දිනය වන 1970.07.02 වැනි දින සිට අඛණ්ඩ සේවයක් ලෙස සලකා නොමැති බවත් කරුණු දක්වා සිටී. ඒ නිසා මොහුට බලපානුයේ පැරණි චක්‍රලේඛනය නොව නව එකක් බවත්, ඒ අනුව 55 විශ්‍රාම යවා ඇති බවත් ප්‍රකාශ කර සිටී.

තව ද කුරුණෑගල කම්කරු විනිශ්චය සභාව වෙත ගොනුකර තිබූ අංක 23/කු/8840/2006 දරන ඉල්ලුම්පත්‍රය 2008.08.21 වැනි දින නිශ්ප්‍රභා කර ඇති බව ද තවදුරටත් ප්‍රකාශ කර ඇත. මේ සම්බන්ධයෙන් කිසිඳු ප්‍රකාශයක් ඉල්ලුම්කරු විසින් සිදුකර නොමැති අතර, ඔහු දිගින් දිගටම පවසා සිටින්නේ තමාට වූ අසාධාරණය වෙනුවෙන් මූල්‍ය සහනයක් ලබාදෙන ලෙස පමණක් වේ.

කෙසේ වූව ද, දෙවැනි පාර්ශවය විසින් මූලික විරෝධතාවයක් මතු කරමින් කරුණු ඉදිරිපත් කර ඇත. එම මූලික විරෝධතාවයේ සඳහන් අධිකරණ බලය පිළිබඳ විරෝධතාවයක් ඕනෑම අවස්ථාවක ඉදිරිපත් කර හැකි බවට ඉදිරිපත්කර ඇති කරුණ පිළිගත යුතු කරුණකි. එම ලිඛිත දේශණයේ 7 වැනි ඡේදයේ සඳහන් විරෝධතාවය ද පනතේ ප්‍රතිපාදනයක් බැවින් එයද පිළිගත යුතු තත්ත්වයකි.

මූලික විරෝධතාවල 9 පරිච්ඡේදය සම්බන්ධයෙන් ඇති නඩු තීන්දුව අනුව එහි උද්ගතව ඇති ගැටළුව වී ඇත්තේ සේවය නතර වී ඇති සේවකයකු සම්බන්ධයෙන් විනා සේවය අවසන් කරන ලද සේවකයකු සම්බන්ධයෙන් නොවේ. සේවය නතරවී ඇති සේවකයකු සම්බන්ධයෙන් සේවය නතර වූ පසු සජීවී ආරවුලක් නොමැති බව පිළිගත හැකි කරුණකි. ඒ අනුව අදාළ නඩු තීන්දුව පිළිගත යුතු කරුණක් වූව ද මේ සම්බන්ධයෙන් තවදුරටත් කරුණු විමසා බැලීමේදී පහත සඳහන් නඩු තීන්දුව කෙරෙහිද අවධානය යොමු කිරීම වැදගත් බව මාගේ අදහසයි.

" S. B. Perera *Vs* Standard Chartered Bank & Others (1995) 1 SLR 73" නඩුව.

එම නඩුවේ දී අමරසිංහ විනිසුරුවරයා ප්‍රකාශ කර ඇත්තේ කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ පත්කරන ලද බේරුම්කරුවකුට, සේවය නතර වීමෙන් (cessation of employement) පසුව ඇතිවූ ආරවුලක් විභාග කිරීමට බලය නැති නමුත්, මෙම නඩුවේ දී ආරවුල හටගෙන ඇත්තේ එම සේවකයා සේවයේ යෙදී සිටින අවධියේදීම වන බැවින් ''පවත්නා කාර්මික ආරවුලක් '' (live dispute) ඇති බැවින් එම ආරවුල 4 (1) වැනි වගන්තිය යටතේ පත්කරන ලද බේරුම්කරුවකුට යොමු කිරීමේ බලය ඇමතිවරයා සතුවන බවයි.

මෙම ඉල්ලුම්කරු හා ආයතනය අතර මෙකී ආරවුල ආරම්භ වී ඇත්තේ විශ්‍රාම යාමට ප්‍රථම බව කාර්මික සම්බන්ධතා අංශයේ ඇති IR/22/16/2005 ගොනුව එනම් මෙම ආරවුල බේරුම්කරුවකුට යොමු කිරීමට කටයුතු කර ඇති ගොනුව පරීක්ෂාවේ දී හෙළිවන කරුණකි. එනම් මෙහිදී ඉහත එස්. බී. පෙරේරා එදිරිව. ස්ටෑන්ඩඩ් චාර්ටඩ් බැංකුව සහ තවත් අය යන නඩුවේදී පිළිගෙන ඇති කරුණු අනුව එම නීති තත්ත්වය යටතේ මෙම ආරවුල සජීවී ආරවුලක් බැවින් පනතේ 4 (1) යටතේ ඇමතිවරයා විසින් පත්කරනු ලබන බේරුම්කරුවකුට අධිකරණ බලය නැතැයි කීම ප්‍රතික්ෂේප කරමි.

ඒ අනුව ඉන්පසුව ඉදිරිපත් කර ඇති 10, 11, 12 ඡේදයන් වල ඇති කරුණු ද ප්‍රතික්ෂේපවන බැවින් මෙම බේරුම්කරණයට අධිකරණ බලයක් නොමැතිය යන විරෝධතාවය එනයින්ම ප්‍රතික්ෂේප වන බව ද පෙනී යයි. තව ද, මූලික විරෝධතාවල ඇති 14 පරිච්ඡේදයේ ද ඉහත තත්ත්වය මත ප්‍රතික්ෂේප වන බව තීරණය කරමි. ඒ අනුව මෙම බේරුම්කරණයට මෙම ආරවුල පවත්වා ගෙන යාමට නිසි අධිකරණ බලයක් ඇති බව තීරණය කරමි.

කරුණු මෙසේ වුව ද, මෙම ආරවුල විසඳීමේ බලය මෙම ගරු බේරුම්කරණය වෙත තිබුණ ද පළමු පාර්ශවයේ ඉල්ලුම්කාර සේවකයා විසින් කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරීට ද පිටපතක් සහිතව 2019.10.30 දිනැති ලිපිය මගින් ගරු කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යොමුකර ඇති ලිපිය මගින් මෙම විභාගයෙන් තමා ඉවත්වීමට තීරණය කර ඇති බව දක්වා තිබීමෙන් ද, මේ සම්බන්ධයෙන් පළමු පාර්ශවයේ ඉල්ලුම්කරු කිසිදු විටක නඩු විභාගයේදී තම පිළිතුරු හෝ ප්‍රති පිළිතුරු ගොනු කිරීමක් හෝ නිසි පරිදි නඩුවට ඉදිරිපත් වීමක් ද නොවීම යන හේතු මත මෙම නඩුව ඉල්ලුම්කාර පළමු පාර්ශවයේ සහභාගිත්වයක් නොමැතිව පවත්වාගෙන යාමට මෙම ගරු බේරුම්කරණයට හැකියාවක් නොමැති බැවින් මෙම නඩුව අවසන් කිරීමට සිදුවන බව පෙනී යයි. ඒ අනුව පළමු පාර්ශවයේ නිසි සහයෝගයක් නොමැතිකම මත හා පළමු පාර්ශවය මෙම බේරුම්කරණ නඩුවෙන් ඉවත්වීම මත මෙම නඩුව අවසන් කිරීම තීරණය කරමි.

ප්‍රදානය :

මෙම බේරුම්කරණය වෙනුවෙන් කිසිදු ප්‍රදානයක් නොකරමි.

මෙය සාධාරණවූත්, යුක්ති සහගතවූත් ප්‍රදානයක් බවට තීරණය කරමි.

ඕබඩගේ ලීලාරත්න,
බේරුම්කරු.

2020 ජනවාරි මස 13 වැනි දින.

02 - 255

---

මගේ අංක: IR/COM/04/2019/34.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.04.03 දිනැති හා අංක 2117/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.03.26 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් තලංගම, කොස්වත්ත, සෙත්සිරි මාවත, අංක 259/9 හි පිහිටි අන්තර් සමාගම් සේවක සංගමය සහ කටුනායක, ආයෝජන ප්‍රවර්ධන කලාපය, දෙවන අදියර, තැ. පෙ. 15 හි පිහිටි නොරාටෙල් ඉන්ටනැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.12.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ජනවාරි මස 27 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05 දී ය.

**කාර්මික අධිකරණයේ දී ය.**

අන්තර් සමාගම් සේවක සංගමය,
අංක 259/9,
සෙත්සිරි මාවත,
කොස්වත්ත,
තලංගම.

*පැමිණිලිකාර පාර්ශවය*

*නඩු අංකය* : A/33/2019
IR/COM/04/2019/34

*එදිරිව*

නොරාටෙල් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඞ්,
තැ. පෙ. අංක 15, දෙවන අදියර,
ආයෝජන ප්‍රවර්ධන කලාපය,
කටුනායක.

*වග උත්තරකාර පාර්ශ්වය*

වර්ෂ 2019 ක් වූ දෙසැම්බර් මස 20 වැනි දින දී ය.

**බලතල පැවරීම :**

ඉහත සඳහන් පාර්ශවයන් අතර පවත්නා ආරවුල කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතාට 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවිය යුතු) පනත්වලින් සංශෝධිත ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තියෙන් අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා වෙත යොමුකොට තිබේ.

**උද්ගතව පවත්නා කාර්මික ආරවුල :**

වග උත්තරකාර පාර්ශවය වන නොරාටෙල් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඞ් ආයතනයේ 2019.02.11 වන දින සිට එකඟතාවයකින් තොරව පවත්නා වැඩ වර්ජනයට හේතු වූ 2019 වර්ෂය සඳහා වැටුප් වැඩි කිරීමේ දී අන්තර් සමාගම් සේවක සංගමය ඉල්ලා සිටින රු. 500.00 ක මුදල සමග 16.5% ක් වූ මූලික වැටුප වැඩි කිරීමට කරන ලද ඉල්ලීම සාධාරණ වන්නේ ද යන්න හා එසේ නොවේ නම් එම සේවකයන්ට කුමන සහනයක් හිමිවිය යුතු ද යන්න පිළිබඳව කරුණු පරීක්ෂා කරබලා සුදුසු වූ ප්‍රදානයක් කිරීම මෙම අධිකරණයේ කාර්යභාර්ය වී තිබේ.

**ආරවුල සම්බන්ධයෙන් පාර්ශවයන්ගේ කරුණු දැක්වීම :**

ඉහත සඳහන් කාර්මික ආරවුල සම්බන්ධයෙන් වූ නඩුව විභාගයට ගැනීමට පූර්වයෙන් 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ අංක 39 දරන ආඥාව යටතේ 1959 මාර්තු මස 02 වන දිනැති අංක 11688 දරන රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1969 කාර්මික ආරවුල් පනත යටතේ වූ නියෝග සංග්‍රහයේ 21 (1) දරන නියෝගයේ දැක්වෙන පරිදි මෙම ආරවුලට හේතු වී ඇති කරුණු කාරණා සම්බන්ධයෙන් පාර්ශවයන් වෙතින් ලිඛිත විස්තර ප්‍රකාශ ඉල්ලා සිටි අතර පැමිණිලිකාර පාර්ශවය මෙන්ම වග උත්තරකාර පාර්ශවය විසින් ද එහිදී ලිඛිත කරුණු ඉදිරිපත් කර තිබේ.

ඒ අනුව අදාළ පාර්ශවයන්ගේ කරුණු ඉදිරිපත් කිරීම පිළිබඳව සලකා බැලීමේ දී පැමිණිලිකාර පාර්ශවය වශයෙන් අන්තර් සමාගම් සේවක සංගමය විසින් වර්ෂ 2019 ක් වූ ජූලි මස 26 දිනැතිව ඉදිරිපත් කරන ලද පළමු ප්‍රකාශය කෙරෙහි අධිකරණයේ දැඩි අවධානය යොමු කරන ලදී. එම ප්‍රකාශයේ 05 වන ඡේදය යටතේ කරුණු දක්වමින් X1 ලෙස ලකුණු කරන ලද ලේඛනයක් ඉදිරිපත් කර තිබේ. අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපතිවරයා විසින් 2019.04.10 දිනැතිව කම්කරු කොමසාරිස් ජනරාල්වරයා අමතන ලද එම

ලේඛනයේ තෙවන ඡේදය මෙසේ ප්‍රකාශ කරයි. එනම් "කෙසේ වුව ද මෙම කාර්මික ආරවුල විසඳා ගැනීම සම්බන්ධව සේවකයන් අතිශය විශ්වාසය තැබූ කම්කරු දෙපාර්තමේන්තුව ද මේ ආකාරයෙන් ඒක පාර්ශිකව බේරුම්කරුවකු පත් කිරීම සිදු වන්නේ ශ්‍රී ලංකාවේ කම්කරු නීති ඉතිහාසයේ පළමු වතාවට බව ද දන්වා සිටිමු. එම නිසා නොරාටෙල් පාලකයන්ගේ උවමනාව වෙනුවෙන් මෙසේ බේරුම්කරුවකු පත් කිරීම බලවත් අසාධාරණයක් බව ප්‍රකාශ කර සිටින අතර එය පිළිකුලෙන් යුතුව හෙළා දකිමු. එයට අපගේ දැඩි විරෝධය ද මේ සමග ප්‍රකාශ කරන්නෙමු." යනාදී වශයෙනි. මෙම ප්‍රකාශය පිළිබඳව අදාළ බේරුම්කරු වශයෙන් කිසියම් කරුණු පැහැදිලි කිරීමක් නොකරන්නේ නම් එය මගේ වගකීම පැහැර හැරීමක් ලෙස සළකමි.

ඉහත සඳහන් පාර්ශවයන් අතර උද්ගතව පවත්නා මෙම ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවකු පත් කිරීමට කටයුතු කරනු ලැබ ඇත්තේ කම්කරු අමාත්‍යවරයා වෙත 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තිය ප්‍රකාරව ඔහු වෙතම පැවරී ඇති බලතල අනුව ය. ඒ සඳහා අමාත්‍යවරයාට කිසිදු පාර්ශවයක එකඟතාවය අවශ්‍ය නොවේ. එම නිසා අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපතිවරයා ප්‍රකාශ කරන ආකාරයට මෙය ශ්‍රී ලංකාවේ කම්කරු නීති ඉතිහාසයේ පළමු වතාවට සිදු වන්නක් නොවන අතර කාර්මික ආරවුල් පනත ක්‍රියාත්මක වූ දා සිටම මේ දක්වා ද එහි අන්තර්ගතව පවත්නා නෛතික තත්ත්වය පදනම් කර ගනිමින් සිදු වෙමින් පවත්නා නීත්‍යානුකූල තත්ත්වයක් පමණි.

එහෙයින් පිළිකුලෙන් යුතුව හෙළා දැකිය යුතු වන්නේ බේරුම්කරුවකු පත් කිරීම නොව අදාළ පනත සහ එම නීතිමය තත්ත්වයන් එමගින් අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල පිළිබඳවත් කිසිදු අවබෝධයකින් තොරව කරනු ලබන මෙවැනි ප්‍රකාශයන් බව කිව යුතුව තිබේ. අදාළ ආරවුලට අයත් පාර්ශවයන්ගේ එකඟතාවය මත පමණක් ආරවුල සමථයකට පත් කිරීම සඳහා කාර්මික ආරවුල් පනතේ විධිවිධානයන් මගින් කම්කරු කොමසාරිස් ජනරාල්වරයාට පැවරී ඇති බලතල හා පාර්ශවයන්ගේ එකඟතාවය විමසීමකින් තොරව අදාළ ආරවුල සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු හෝ බේරුම්කාර මණ්ඩලයක් පත් කිරීම පිළිබඳව පනත මගින් අමාත්‍යවරයාට පැවරී ඇති බලතල පිළිබඳව පනත හැදෑරීමෙන් හෝ ඒ පිළිබඳව දන්නා අයෙකු වෙතින් අසා දැන ගැනීමෙන් හෝ තමන් තුළ පවත්නා අනවබෝධය දුරුකර ගත හැකි ය. එපමණක් ද නොව විශාල සේවකයන්ගේ රැකියා සුරක්ෂිතභාවය පිළිබඳවත් ඔවුන්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ ජීවිත පැවැත්ම පිළිබඳවත් අවධානය යොමු කළ යුතු සංගමයක් වශයෙන් කිසියම් ප්‍රකාශයක් සිදු කිරීමේ දී එය වගකීමක් සහිතව හා අවබෝධයෙන් යුතුව සිදුකළ යුතුව තිබෙන බව මනාව වටහාගෙන කටයුතු කිරීමත්, තම ඉල්ලීම් දිනා ගනිමින්ම එම ව්‍යාපාරික ආයතනයේ පැවැත්ම අරභයා හැකි ආකාරයෙන් දායක වීමට ද කටයුතු කිරීමේ ඇති වැදගත්කමත් වටහාගත යුතුව ඇති කරුණක් බව මෙහිලා සඳහන් කරනු කැමැත්තෙමි.

**විසඳිය යුතු ප්‍රශ්න :**

නොරාටෙල් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ 2019.02.11 වැනි දින සිට එකඟතාවයකින් තොරව පවත්නා වැඩ වර්ජනයට හේතු වූ 2019 වර්ෂය සඳහා වැටුප් වැඩි කිරීමේ දී අන්තර් සමාගම් සේවක සංගමය ඉල්ලා සිටින රු. 500.00 සමග 16.5%ක මූලික වැටුප වැඩි කිරීමට කරන ඉල්ලීම සාධාරණ ද?

එසේ නොවේ නම් අදාළ සේවකයන්ට කුමන සහනයක් හිමිවිය යුතු වන්නේ ද? යනාදිය වේ.

මෙහි ඉහතින් සඳහන් කරන ලද ආකාරයට පාර්ශවයන් විසින් ආරවුලට අදාළව ඉදිරිපත් කරන ලද කරුණු කෙරෙහි පමණක් අවධානය යොමු කරමින් මෙම නඩුව විභාගයට ගැනීමට තීරණය කරන ලද අතර ඒ අනුව ප්‍රථම වතාවට 2019.05.28 වැනි දින පෙ.ව. 11.00 ට පාර්ශවයන් කැඳවන ලදී. එදින පාර්ශවයන් දෙකම අධිකරණය ඉදිරියේ පෙනී සිටි අතර ඉන් ඉක්බිතිව ද අවස්ථා කිහිපයක දී ම පාර්ශවයන් අධිකරණය ඉදිරියේ ඉතා දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් කිරීම් කරන ලදී. ඒ කෙසේ වුව ද අවසාන වශයෙන් පාර්ශවයන්ගේ කිසියම් සාධාරණ වූ එකඟතාවයක් පවතින්නේ ද යන්න පිළිබඳව කරුණු විමසන ලදුව ඒ ඒ පාර්ශවයන් විසින් ඉදිරිපත් කරන ලද සමථ යෝජනාවන් ඔවුන් විසින් ම එකඟතාවයකට පත් නොවී අවසන් කිරීම හේතු කරගෙන නඩුව විභාගයට ගැනීමට අධිකරණය තීරණය කරනු ලැබීය.

මෙහිදී අධිකරණය පාර්ශවයන් වෙත අවධාරණය කර සිටියේ නඩු විභාගය ආරම්භ කළ ද එය කිසිසේත් ඉදිරියේ වුව ද ඉදිරිපත් කෙරෙන සමථ යෝජනාවකට බාධාවක් නොවන බවයි. ඒ අනුව 2019.10.22 වැනි දින නඩු විභාගය ආරම්භ කරමින් පළමුවෙන්ම සාක්ෂි මෙහෙයවීම පැමිණිලිකාර පාර්ශවය වෙත පවරනු ලැබීය. මේ ආකාරයෙන් නඩුව විභාග වෙමින් පැවතිය දී වග උත්තරකාර පාර්ශවය විසින් 2019.11.25 වැනි දින සමථ යෝජනාවක් අධිකරණය ඉදිරියේ ගෙනහැර දක්වන ලදී. එනම් සම්පූර්ණ හා අවසන් සමථයක් වශයෙන් වර්ෂ 2019 ක් වූ නොවැම්බර් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි 12% ක වැටුප් වැඩිවීමක් හා රු. 500.00 ක මුදලක් ලබාදීමට තමන් එකඟ බවත් මෙය පූර්වාදර්ශයක් නොවිය යුතු බවත් ය.

එහිදී වැඩි දුරටත් ප්‍රකාශ කර සිටියේ දැනට ක්‍රියාකාරී සේවයේ යෙදී සිටින සහ මේ දක්වා වැටුප් වර්ධක නොලැබුණු සියලුම සේවකයන්ට මෙය අදාළ කරන බවය. වර්ෂ 2019 ජනවාරි මස 01 වැනි දිනට ක්‍රියාත්මක වන සේවා කාලය පදනම් කරගෙන එය සම්පූර්ණ කරනු ලබන සේවකයන්ට මෙම වැටුප් වර්ධකය ගෙවීමට සූදානම් බව ද වග උත්තරකාර පාර්ශවය ප්‍රකාශ කර සිටියේ ය.

මෙම සමථ යෝජනාව සම්බන්ධයෙන් පැමිණිලිකාර පාර්ශවය සිය මූලික එකඟතාවය පළකර සිටි අතර ඉන් බැහැරව වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියේ දැනට විනය හේතූන් මත වැඩ තහනමට ලක්ව සිටින සේවකයන් 68 දෙනාට ද යළි සේවය ලබා දෙන්නේ නම් ඔවුන්ට ද 2019.11.01 වැනි දින සිටම මේ වැටුප් වැඩිවීම ලබාදෙන ලෙසය.

මේ අනුව පැමිණිලිකාර පාර්ශවයේ එකඟතාවය තුළ මුල් සමථ යෝජනාවට පරිබාහිර වූ කරුණක් ඇතුළත් වීම හේතුකරගෙන අධිකරණය විසින් එම කරුණ අවධාරණය කරමින් ඒ පිළිබඳව වග උත්තරකාර පාර්ශවයේ අදහස් විමසන ලදුව එයට වග උත්තරකාර පාර්ශවය එකඟතාවය පළ කරන ලදින් නඩු විභාගය අවසන් කිරීමට තීරණය කරනු ලැබීය.

**ප්‍රදානය**

වර්ෂ 2019 ක් වූ ජනවාරි මස 01 වැනි දිනට ක්‍රියාත්මක වන සේවා කාලය පදනම් කර ගනිමින් හා එය සම්පූර්ණ කරනු ලබන සේවකයන්ට දැනට ක්‍රියාකාරී සේවයේ යෙදී සිටින මෙන්ම මේ දක්වා වැටුප් වර්ධක නොලද සේවකයන්ට වර්ෂ 2019 ක් වූ නොවැම්බර් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි 12% ක වැටුප් වැඩි වීමක් හා රු. 500.00 ක මුදලක් ලබාදීම.

මේ වන විට වැඩ තහනමට ලක්වී සිටින සේවකයන් 68 දෙනා යළි සේවයේ යොදවන්නේ නම් ඔවුන්ට ද 2019.11.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම වැටුප් වැඩිවීම ලබා දීමට කටයුතු කිරීම. මෙය සම්පූර්ණ හා අවසන් සමථයක් වීමත් ඉදිරි වැටුප් පිළිබඳ අවස්ථාවලදී මෙම සමථ යෝජනාව පූර්වාදර්ශයක්කොට නොගන්නා බවට වූ එකඟතාවය.

මෙය සාධාරණවූත් යුක්ති සහගතවූත් සමථයක් බවට තීරණය කරමි.

ලොරා සුමතිපාල,
බේරුම්කරු,

වර්ෂ 2019 ක් වූ දෙසැම්බර් මස 20 වැනි දින දී ය.

02 - 265

---

මගේ අංක: IR/12/02/2005 (Sub).

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2014.08.21 දිනැති හා අංක 1876/35 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2014.08.04 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් පන්නිපිටිය, රුක්මලේ, බාලිකා නිවාස පාර, අංක 213/39 හි පදිංචි ජී. එච්. උදය සමන් මයා සහ කොළඹ 08, ඇල්විටිගල මාවත, වික්ටෝරියා පෙදෙස, අංක 18 හි පිහිටි ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.12.12 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ජනවාරි මස 27 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

නාරාහේන්පිට කාර්මික අධිකරණයේ දී ය.

ඊ. එච්. උදය සමන්,
අංක 213/39, බාලිකා නිවාස පාර,
රුක්මලේ,
පන්නිපිටිය.

*පළමු පාර්ශවය*

*බේරුම්කරණ අංක* : A/3576
IR/12/02/2005/(SUB)

*සහ*

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය,
අංක 17, වික්ටෝරියා පෙදෙස,
ඇල්විටිගල මාවත,
කොළඹ 08.

*දෙවැනි පාර්ශවය*

*අතර පවත්නා කාර්මික ආරවුල සම්බන්ධ ප්‍රදානය*

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ ඇමතිතුමාගේ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2014.08.04 දින පත්කොට මා වෙත යොමු කොට ඇත.

වර්ෂ 2014 ජූලි මස 25 වැනි දිනැති කම්කරු කොමසාරිස් ජනරාල්තුමාගේ යොමුවේ පහත පරිදි දැක්වේ :

'' ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නියැදි නිලධාරි/තාක්ෂණික සහකාර ලෙස සේවය කරනු ලබන ජී. එච්. උදය සමන් මයා 1994.07.13 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි නියැදි නිලධාරි/තාක්ෂණික සහකාර ii ශ්‍රේණියේ පිහිටුවීමට හා 2003 වර්ෂයේ නියැදි නිලධාරි/තාක්ෂණික සහකාර i ශ්‍රේණිය ලබා ගැනීම වෙනුවෙන් ද, එසේම 2006 වර්ෂයේ දී ආයතනයේ වැටුප් ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ දී ජ්‍යෙෂ්ඨ කාර්මික නිලධාරි තනතුර හා සහකාර අධ්‍යක්ෂ තනතුර ලබාගැනීම වෙනුවෙන් ද කරනු ලබන ඉල්ලීම යුක්ති සහගත ද, එසේ යුක්ති සහගත නම් ඔහුට හිමි විය යුතු සහන කවරේ ද යන්න පිළිබඳව වේ''.

උක්ත යොමුවේ සඳහන් සිද්ධිගත ආරාවුලට අදාළව මෙම දෙපාර්ශවය විසින් කාර්මික ආරාවුල් පනතේ නියෝග සංග්‍රහයේ 21 (1) හා 21 (2) වගන්ති ප්‍රකාරව සිය පළමු හා දෙවැනි ප්‍රකාශ ගරු බේරුම්කරණය වෙත යොමු කර ඇති බව ද මා සැලකර සිටී.

ඉන් අනතුරුව පළමු පාර්ශවය විසින් සිය නඩුව ආරම්භ කර ඇති අතර, ඉල්ලුම්කාර උදය සමන් මහතා දීර්ඝ ලෙස සිය සාක්ෂිය ලබා දී ඇත. 1993.05.14 දින නියැදි නිලධාරි/තාක්ෂණික සහකාර ii ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර, ඒ වන විට ඉල්ලුම්කරු අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බවට දෙපාර්ශවයේම සාක්ෂි හා හරස් ප්‍රශ්න මගින් තහවුරු වී ඇත. ඒ අතර 1994.07.13 දින සිට මෙම ඉල්ලුම්කරු නියැදි නිලධාරි/තාක්ෂණික සහකාර iii ශ්‍රේණියට පත්කර ඇත්තේ කැඳවන ලද අයදුම්පත් අනුව පවත්වන ලද පරීක්ෂණයෙන් බව ද පැහැදිලි වේ.

ඉන්පසුව 1995.06.09 නියැදි නිලධාරි/තාක්ෂණික සහකාර ii ශ්‍රේණිය සඳහා ඉල්ලුම්පත් කැඳවා ඇති අතර ඉල්ලුම්කරු සම්මුඛ පරීක්ෂණයෙන් අසමත් වී ඇති බව පැහැදිලි වේ. 1996 වසරේ දී උක්ත තනතුර සඳහා ඉල්ලුම්පත් කැඳවා ඇති අතර පැවති සම්මුඛ පරීක්ෂණයේ දී ප්‍රමාණවත් ලකුණු නොලැබීමේ හේතුව මත මෙම ඉල්ලුම්කරුට තනතුර ප්‍රදානය කර නැත.

ඉන්පසුව 1997.05.12 ඉහත තනතුරට ඉල්ලුම්පත් කැඳවා ඇති අතර එම සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙසට මෙම ඉල්ලුම්කරු 1997.06.26 දින සිට බලපැවැත්වෙන පරිදි නියැදි නිලධාරි/තාක්ෂණික සහකාර ii ශ්‍රේණියට උසස්වීම ලබා දී ඇත.

තමන්ට කිහිප අවස්ථාවකදීම මෙම තනතුර ලබා නොදීමෙන් අසාධාරණයක් වූ බව පවසමින් කම්කරු දෙපාර්තමේන්තුවේ මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කොමාසරිස් කාර්යාලයට මෙම ඉල්ලුම්කරු පැමිණිලි කර ඇති අතර, එහිදී එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කොමසාරිස් කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස්වරයා විසින් තීරණයක් ලබා දී ඇත. තව ද, මෙම ඉල්ලුම්කරු තමාට සිදු වූ අසාධාරණය සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව වෙතට පැමිණිල්ලක් යොමු කරන ලදුව එම පැමිණිල්ල ද මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කර ඇත.

මෙම සම්මුඛ පරීක්ෂණ කිහිපයක දී ම තමන්ට අසාධාරණයක් සිදු වූ බවට පළමු පාර්ශවයේ ඉල්ලුම්කරු දිගින් දිගටම ප්‍රකාශ කළ ද අදාළ සම්මුඛ පරීක්ෂණයේ දී තමාට අසාධාරණයක් වූවා ද යන්න ඔප්පු කිරීමට කිසිදු සාක්ෂියක් පළමු පාර්ශවය විසින් ඉදිරිපත් කර නොමැත. මන්ද යත් මෙහිදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය අසාධාරණ හා අයුක්ති සහගත ලෙස තමාට එම තනතුර නොදුන් බවට කරුණු තහවුරු කරන තාක්කල් එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය එසේ කටයුතු කළාය යන්න ඔප්පු නොවන බැවිනි. තවද, මෙම ඉල්ලුම්කරු කරුණු දක්වමින් තමන් පසුකාලීනව මෙම තනතුරු සඳහා ඉල්ලීම් නොකළේ කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිලි කිරීමෙන් මෙම තනතුර තමාට ලබාගැනීමට හැකිය යන විශ්වාසය තමා තුළ තිබූ බැවින් වන බව ද සිය සාක්ෂියේ දී පවසා ඇත. ආයතනයක් තුළ උසස්වීම් ලබාදෙනුයේ නිසි පරිදි අයදුම්පත් කැඳවා පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත බව පැහැදිලි කරුණකි. කොපමණ සුදුසුකම් සපුරා තිබුණ ද  අයදුම්පත් ඉදිරිපත් නොකර කිසිදු විටක උසස්වීම් ලබාදීමට ආයතනයක් බැඳී නොමැති බවද මෙහි දී සලකා බලන ලදී. ඒ අනුව 2003 න් පසුව 2013 දක්වාම මෙම ඉල්ලුම්කරු තනතුරු සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් නොකිරීම පිළිබඳව ද විශේෂ අවධානය යොමු කළෙමි.

කෙසේ වුව ද නව බඳවා ගැනීමේ පටිපාටිය අවුල් සහගත බැවින් පැරණි බඳවා ගැනීමේ පටිපාටියම අනුගමනය කරමින් කටයුතු කරන  ලෙසට තාක්ෂණික හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම් ධාරා විජේතිලක මහත්මිය විසින් 2001.07.01 දිනෙන් ඒ 53 ලේඛනය නිකුත්කර ඇති බව නිරීක්ෂණය විය.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද කළමණාකරන සේවා චක්‍රලේඛ 30-1 අනුව එය ක්‍රියාත්මක කළ යුතුව තිබුණේ 2006.01.01 දින සිට බවත් එය ක්‍රියාත්මක කළේ 2009.10.26 දින බවත් පළමු පාර්ශවය සිය සාක්ෂිය මගින් කරුණු ඉදිරිපත් කර ඇත. දෙවැනි පාර්ශවය විසින් සිය හරස් ප්‍රශ්නවලදී මෙම ඉල්ලුම්කරු 1993 වසරේ නියැඳි නිලධාරි / තාක්ෂණික සහකාර ii ශ්‍රේණියට ඉල්ලුම්කළ ද එම අවස්ථාවේ එම තනතුරට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බවට තහවුරු කර ඇත.

ඉන්පසු මෙම තනතුර සඳහා ඉල්ලුම්පත් කැඳවා ඇත්තේ 1995 වසරේ දී වේ. එසේ තිබිය දී 1994 වර්ෂයේ සිට එම තනතුරේ පිහිටුවීමට සාධාරණ හේතුවක් පළමු පාර්ශවය විසින් ඉදිරිපත් කර නොමැත. පළමු පාර්ශවයේ විත්ති වාචකය වූයේ 1994 දී තමන් සුදුසුකම් සපුරා ඇති බැවින් එම තනතුරේ පිහිටුවීමට කටයුතු කළ යුතු බවයි.

1997 වර්ෂයේ නැවත අයදුම්පත් කැඳවා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල ලෙස මෙම ඉල්ලුම්කරු ii ශ්‍රේණියට පත්කර ඇත.

නියැඳි නිලධාරි / තාක්ෂණික සහකාර i ශ්‍රේණියට 2004 ඉල්ලුම්පත් කැඳවා ඇති අතර එම සම්මුඛ පරීක්ෂණයෙන් මෙම ඉල්ලුම්කරු අසමත් වී ඇති අතර ඉන්පසුව 2013 වර්ෂය වන තෙක් තමන් මෙම තනතුර සම්බන්ධයෙන් ඉල්ලුම්පත් ඉදිරිපත් නොකළ බවට ඉල්ලුම්කරු විසින් ම හරස් ප්‍රශ්න විමසීමේ දී පිළිගෙන ඇත.

තව ද පළමු පාර්ශවය විසින් බඳවා ගැනීමේ පටිපාටිය ඒ 05 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇති අතර, පැරණි බඳවා ගැනීමේ පටිපාටිය ඒ 16 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇති අතර, ඒ 16 ට ප්‍රථම ඒ 5 බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කර ඇති බවට කරුණු තහවුරු කර ඇත. තව ද ඒ 16 ලෙස ඉදිරිපත් කර ඇත්තේ බඳවා ගැනීමේ පටිපාටියට අයදුම්පත් එවීමේ ලිපියක් බවට ද තහවුරු කර ඇති බැවින් එය බඳවා ගැනීමේ පටිපාටියක් ලෙසට සැලකීමට ද හැකියාවක් නොමැත.

තව ද, 1997 නියැදි නිලධාරි / තාක්ෂණික සහකාර ii ශ්‍රේණියට උසස්කර ඇති අතර, 2003 වසරේ දී පළවෙනි ශ්‍රේණිය සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර, ඉන්පසුව 2013 දක්වා අයදුම්පතක් ඉදිරිපත් කර නැත. 2014 දී i ශ්‍රේණිය ලබා දී ඇති අතර, ඒ අනුව සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික තනතුර ලබාදීම සඳහා වසර 5ක සේවා කාලය සපුරා නොමැති බවට ද සාක්ෂි ලබාගෙන ඇත.

දෙවැනි පාර්ශවයේ සාක්ෂිකරු වශයෙන් ඉදිරිපත් වී ඇති ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සිය සාක්ෂි ලබාදෙමින් කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ මත සේවකයන් අන්තර්ග්‍රහනය කිරීමේ දී එමගින් ලබා දී ඇති උපදෙස් මත මෙම සේවකයන් කළමණාකරණ සහකාර තාක්ෂණික තනතුරු සඳහා අන්තර්ග්‍රහනය කර ඇති අතර, ඒ අනුව 2006 දී MA2.2 - ii , ලබා දී ඇති අතර මෙම ඉල්ලුම්කරුට 2014.07.13 දින සිට MA2.2- i ශ්‍රේණිය ලබා දී ඇති බවත්, බඳවා ගැනීමේ පටිපාටියට අනුව වසර 10කින් පසුව මෙම උසස්වීම ලැබිය යුතු මුත් ආයතනය විසින් වසර 8ක් සපුරා තිබිය දී මෙම ඉල්ලුම්කරුට එම ශ්‍රේණිය ලබාදුන් බවටත් සාක්ෂි ඉදිරිපත් කර ඇත. එහෙත් ඉල්ලුම්කරු තමන්ට ලැබුණු මෙම වාසිය කිසිදු අවස්ථාවක කරුණු වශයෙන් හෝ සාක්ෂි වශයෙන් ලබා දී නොමැති අතර දෙවැනි පාර්ශවයේ මෙම සාක්ෂිය කිසිදු අවස්ථාවක ප්‍රතික්ෂේප කර නොමැත.

තව ද පළමු පාර්ශවය විසින් 1993 වසරේ පැවැත්වූ නියැදි නිලධාරි/තාක්ෂණික සහකාර ii ශ්‍රේණිය සඳහා අයදුම්පත් කැඳවා ඉන් අසමත් වූ දෙදෙනෙකු අතරින් එක් අයකුට නැවත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා උසස්වීම ලබාදුන් බවට කරුණු දක්වා ඇතත් කිසිදු අවස්ථාවක දී එම කරුණ සනාථ කිරීමට සාක්ෂි හෝ ලේඛන ඉදිරිපත්කර නොමැත. මේ අනුව ද මෙම ඉල්ලුම්කරුට සමානව නොසැලකුවාය යන්න තහවුරු කර නොමැති බැවින් එම කරුණ ද මෙහි දී සලකා බැලීමට හැකියාවක් නොමැති බව ද සැලකිල්ලට ගතිමි.

තව ද, 1993 න් පසුව 1995, 1996, 1997 නැවතත් නියැදි නිලධාරි/තාක්ෂණික සහකාර ii ශ්‍රේණිය සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර 1997 දී තනතුර ලබා දී ඇත. මේ අතුරින් 1993 වසරේ දී මෙම ඉල්ලුම්කරු සුදුසුකම් සපුරා නොමැති බවට තහවුරු වී ඇති අතර, 1994 දී iii ශ්‍රේණියට උසස්කර ඇත්තේ ඔහු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයකට අනුව බව ද පෙනේ. එහෙත් ඉල්ලුම්කරු පවසන්නේ තමන්ට iii ශ්‍රේණිය ලබා දුන් දින සිට ii ශ්‍රේණිය ලබාදිය යුතු බවයි. එසේ ලැබිය යුතු බව ඔහු විසින් පවසන්නේ ඒ වන විට ii ශ්‍රේණියට අවශ්‍ය සුදුසුකම් තමා සපුරා ඇති බැවින්ය යන්න ඔහුගේ තර්කය වේ.

එහෙත් කෙනෙකු තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති පමණින්ම එම තනතුරට පත්කළ යුතු බවට වන ක්‍රමවේදයක් මෙම ආයතනයේ ඇති බවට සාක්ෂි මගින් තහවුරු වී නැති බැවින් එසේ කෙනෙකු සුදුසුකම් ලැබූ පමණින්ම අදාළ තනතුරකට පත්කිරීමට කිසිඳු අවස්ථාවක දෙවැනි පාර්ශවය බැඳී නොසිටින බව ද සැලකිල්ලට ගතිමි. අනෙක් අතට පළමු පාර්ශවය නිරන්තරයෙන්ම තර්ක කරනු ලැබුවේ සම්මුඛ පරීක්ෂණවලින් තමාට සාධාරණයක් ඉටුනොවූ බවට තහවුරු කිරීමට වුව ද ඔවුන් විසින් කිසිදු අවස්ථාවක එකී සම්මුඛ පරීක්ෂණ මණ්ඩල අයුක්ති සහගත හා අසාධාරණව කටයුතු සිදුකළාය යන්න ඔප්පු කිරීමට අසමත් වී ඇත. ඒ සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක් මෙම පළමු පාර්ශවය විසින් ඉදිරිපත් කර නොමැත.

තව ද, කම්කරු දෙපාර්තමේන්තුව වෙත හා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි දෙකම ප්‍රතික්ෂේප වීම ද සලකා බැලිය යුතු වේ. තවද, පළමු පාර්ශවය විසින් තමන් සුදුසුකම් සපුරා ඇති බවට කරුණු ඉදිරිපත් කරන ආර් 11 ලේඛනයේ ජාතික වෘත්තීය සුදුසුකම් නොවන වෘත්තීය සුදුසුකම් හා ගැලපීය යන මාතෘකාව යටතේ NVQ level 5 ලෙසට පිළිගෙන ඇත්තේ 03/2014 චක්‍රලේඛය මගින්වන අතර ඒ අනුව එම තත්ත්වය බලපැවැත්වෙන්නේ 2014 නිකුත් කර ඇති චක්‍රලේඛනයක් පදනම්ව වන බැවින් එය 2014 ඒ නියමිත දින සිට වලංගු එකක් බව ද සැලකිල්ලට ගතිමි. ඒ අනුව මෙම තත්ත්වය ඊට පෙර ගැලපීමට හැකියාවක් නොමැති බව ද සැලකිල්ලට ගතිමි.

තව ද, පළමු පාර්ශවය විසින් සිය අවසාන ලිඛිත දේශනය මගින් තමාට දෙවැනි පාර්ශවය විසින් අසමාන ලෙස සැලකුවාය යනුවෙන් ගෙනඑනු ලබන කරුණු කියාපෑම කිසිදු අවස්ථාවක සිය සාක්ෂි මගින් හෝ ලේඛන මගින් තහවුරු කිරීමට පළමු පාර්ශවය උත්සාහ ගෙනවත් නොමැති බව ද නිරීක්ෂණය විය.

දෙවැනි පාර්ශවය සිය ලිඛිත දේශන මගින් සිය නඩුව තහවුරු කිරීමට උත්සාහ ගෙන ඇති අතර නඩු තීන්දු කිහිපයක් ද උපුටා දක්වා ඇත. එම නඩු තීන්දු ද මෙම ප්‍රදානය ලබාදීමේ දී සැලකිල්ලට ගත් බව ද වැඩිදුරටත් සඳහන් කරමි.

කෙසේ වුව ද, සාක්ෂි හා ලේඛන අනුව සලකා බලන විට දෙපාර්ශවයේම දෝෂ සහගත තත්වයන් නිරීක්ෂණය වුව ද මෙම ප්‍රදානය ලබාදීමේ දී වැඩිබර සාක්ෂිමත තීරණයක් ලබාදීම යුක්ති සහගත සහ සාධාරණ තීරණයක් වන බැවින්, පළමු පාර්ශවය වැඩිබර සාක්ෂි මගින් සිය නඩුව තහවුරු කර නොමැති බවත්, තමන් විසින් ඉදිරිපත් කරන ලද මූලික අසාධාරණකම් ඔප්පු කිරීමට පළමු පාර්ශවය අසමත් වී ඇති බවත් තීරණය කරමි.

ඒ අනුව පළමු පාර්ශවය විසින් ඉල්ලා ඇති සහන ලබාදීමට මෙම බේරුම්කරණයට හැකියාවක් නොමැති බවට තීරණය කරමි.

මෙය යුක්ති සහගත සහ සාධාරණ තීරණයක් බව ද සහතික කරමි.

ටී. පියසෝම.
බේරුම්කරු.

2019 දෙසැම්බර් මස 12 වැනි දින.

02 - 266

මගේ අංකය: IR/COM/05/A/2015/180.

## කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2017.11.15 දිනැති හා අංක 2045/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2017.11.09 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් බලල්ල, බලගොල්ලාගම පදිංචි එස්. පී. අනෝමා ශ්‍යාමලී කුමාරි මිය ඇතුළු සේවක පිරිස සහ කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 212/1 හි පිහිටි මධ්‍යම සංස්කෘතික අරමුදල අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.11.29 දිනැති ප්‍රදනය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ජනවාරි මස 29 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය: IR/COM/05/A/2015/180.

## කාර්මික අධිකරණයේ දී ය.

එස්. පී. අනෝමා ශ්‍යාමලී කුමාරි,
බලගොල්ලාගම,
බලල්ල,
(ඇතුළු සේවක පිරිස)

*පළමු පාර්ශවය*

නඩු අංකය : A 44/2017.

සහ

මධ්‍යම සංස්කෘතික අරමුදල,
අංක 212/1, බෞද්ධාලෝක මාවත,
කොළඹ.

*දෙවන පාර්ශවය*

අතර පවතින කාර්මික ආරවුල.

### ප්‍රදානය

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියැවෙන) පනත්වලින් සංශෝධනය වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිත සබඳතා අමාත්‍යවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 2017.11.19 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

**බේරුම්කරණ විභාගයේ පසුබිම, පෙනී සිටීම සහ එය පැවැත්වූ ආකාරය :**

2017.03.14 දිනැති නියෝගය මගින් කම්කරු, වෘත්තීය සමිති සබඳතා සහ සබරගමු සංවර්ධන ඇමැතිවරයා විසින් මෙම කාර්මික ආරාවුල බේරුම්කරණයෙන් විසඳීමට අංක IR/COM/05/A/2015/180 දරන යොමුව යටතේ බේරුම්කරු ටී. ඊ. සාන්තරාජන් මහතා වෙත යොමු කර තිබුණු එකී යොමුව එම ඇමතිවරයා විසින් ම 2017.11.09 මගින් අවලංගු කරනු ලැබ, එකී ආරාවුල බේරුම්කිරීමට නව යොමුවක් යටතේ එම දාතමෙන් ම මා වෙත යොමු කර ඇත. බේරුම්කරණයෙන් විසඳීම සඳහා සාන්තරාජන් මහතා වෙත යොමු කර තිබුණේත් පසුව මා වෙත යොමු කර ඇත්තේ ත් එකම කාර්මික ආරාවුලක් වූ අතර ඒ සම්බන්ධ කාරණය වන්නේ :

> ''මධ්‍යම සංස්කෘතික අරමුදලට අයත් වයඹ චතුරස්‍රයේ යාපහුව, දඹදෙණිය, රිදී විහාරය (රිදීගම) හා නාථගනේ (පඬුවස්නුවර) යන පූජා භූමි වල කැණීම සංරක්ෂණ සහකාර තනතුරේ සේවය කළ එස්. පී. අනෝමා ශ්‍යාමලී කුමාරි ඇතුළු සේවක පිරිසගේ සේවය 2015.11.02 දින සිට අවසන් කිරීම මගින් ඔවුන්ට අසාධාරණයක් සිදුවී තිබේ ද යන්න හා එලෙස අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ''

ඒ අනුව මෙම කාර්මික ආරවුලට අදාළ පරීක්ෂණය යොමු කිරීම් දෙකක් යටතේ අවස්ථා දෙකක දී පහත සඳහන් බේරුම්කරුවන් දෙදෙනා විසින් විභාග කරනු ලැබූවකි.

1. බේරුම්කරු ටී. ඊ. සාන්තරාජන් මහතා - අංක A 14/2017 යටතේ
2. බේරුම්කරු එස්. විරිතමුල්ල මහතා - අංක A 44/2017 යටතේ.

අංක IR/COM/05/A/2015/180 යටතේ යොමු කරනු ලැබූ අංක A 14/2017 වූ පළමු බේරුම්කරණ විභාගය පළමු සහ දෙවන ප්‍රකාශ දෙපාර්ශවයන් විසින් ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු බේරුම්කරු ටී. ඊ. සාන්තරාජන් මහතා ඉදිරියේ 2017.04.27, 2017.06.13, 2017.07.04, 2017.07.28, 2017.08.04 යන දිනයන්හි දී රැස් වී සාක්ෂි විභාගය පවත්වා ඇත. ඉන්පසුව අංක IR/COM/05/A/2015/180 යටතේ ම මා වෙත බේරුම්කරණයෙන් ආරවුල විසඳීමට 2017.11.13 වැනි දින යොමු කරනු ලැබීමෙන් පසුව, 2018.02.02, 2018.03.02, 2018.04.04, 2018.04.23, 2018.05.10, 2018.07.17, 2018.08.01, 2018.09.03, 2018.09.14, 2018.10.09, 2019.10.26, 2019.02.18, 2019.04.10, 2019.07.05 යන දිනයන්හි දී මා විසින් බේරුම්කරණ විභාගය පවත්වා අවසන් කර ඇත. පරීක්ෂණය සඳහා දින නියම කරනු ලැබුව ද 2018.06.21, 2018.12.10, 2019.01.29 දිනයන්හි දී බේරුම්කරණ විභාගය පැවැත්වී නැත.

සේවය අහිමි කරනු ලැබුවේ යයි කියන සේවකයින් 62 දෙනෙකු වෙනුවෙන් පරීක්ෂණය පුරාවට ම නීතිඥ සාලිය එදිරිසිංහ මහතා පෙනී සිටි අතර, දෙවන පාර්ශවයේ ආයතනය වෙනුවෙන් 2018.10.09 වැනි දින දක්වා නීතිඥ දයා ගුරුගේ මහතාත්, අවසන් විභාග දිනය වූ 2019.05.28 වැනි දින නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ නීතිඥ ඩිලානි තිරිමාන්න මෙනෙවියත් පෙනී සිටියහ. 2017.11.26 දිනැති දිවුරුම් පෙත්සම මාර්ගයෙන් දෙවන පාර්ශවය දැනුම් දී ඇත්තේ යොමුවට අමුණා ඇති ලයිස්තුවේ සඳහන් සේවකයින් අතුරෙන් සේවකයින් 62 දෙනෙකු වෙනුවෙන් නීතිඥ සාලිය එදිරිසිංහ මහතා පෙනී සිටින බවයි.

2018.02.02 දින පරීක්ෂණය මුල්වරට මා විසින් කැඳවන ලද අවස්ථාවේ දී දෙපාර්ශවය විසින් එවන ලද පළමුවන ප්‍රකාශයන් ප්‍රතිපාර්ශවයන්ට හුවමාරු කොට භාර දෙන ලදී. 2018.03.02 දින බේරුම්කරණ විභාගයේ දී දෙවන ප්‍රකාශයන් දෙපාර්ශවය විසින් ම භාරදෙන ලදී. මෙදින දෙපාර්ශවය ම නියෝජනය කරන නීතිඥවරු ඒ/14/2017 යොමුව යටතේ බේරුම්කරු ටී. ඊ. සාන්තරාජන් මහතා සාක්ෂි විභාග කොට නැවැත්වූ තැන සිට ඉදිරියට මෙම පරීක්ෂණය කරගෙන යන ලෙස ඉල්ලීමක් කළහ. ඒ වන තෙක් මෙහෙයවා තිබූ සාක්ෂි මෙම යොමුව යටතේ ද දෙපාර්ශවය ම හබ කිරීමකින් තොරව පිළිගන්නා බැවින්, නැවත වතාවක් එකී සාක්ෂි විමසීමෙන් තොරව ඉදිරියට කරගෙන යන ලෙස බේරුම්කරණයෙන් ඔවුහු ඇයද සිටියහ. දෙපාර්ශවයේ ම කැමැත්ත සටහන්කොට කාලය ඉතිරි කරගැනීමේ අදහසින් එම ඉල්ලීමට එකඟ වී සාන්තරාජන් මහතා යටතේ මෙහෙයවා අවසන් කර නොතිබුණු පළමුවන පාර්ශවයේ එච්. බී. බී. එම්. කේ. කුමාරිහාමි නැමැත්තියගේ සාක්ෂිය ඉදිරියට තවදුරටත් මෙහෙයවන ලෙස පාර්ශවකරුවන්ට දැනුම් දෙන ලදී. ඉහත කී ඒ/14/2017 බේරුම්කරණ විභාගය යටතේ 2017.07.18 දින දෙවන පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතාගේ හරස් ප්‍රශ්න විමසීමට භාජනය වෙමින් සිටි එකී සාක්ෂිකාරියගෙන් වැඩිදුරටත් හරස් ප්‍රශ්න විමසීම එදින නැවත ආරම්භ කරන ලදී. එකී සාක්ෂිය අවසන් කිරීමෙන් පසු ව පළමුවන පාර්ශවය වෙනුවෙන් එල්. ඒ. ඩී. දිසානායක සහ සිංහලගේ සාගර සඳරුවන් රණසිංහ යන අයවලුන්ගේ සාක්ෂි විභාග කරන ලදී. අනතුරුව දෙවන පාර්ශවය වෙනුවෙන් මධ්‍යම සංස්කෘතික අරමුදලේ පරිපාලන නිලධාරිණී කමනි පද්මිකා එදිරිමාන්න නැමැත්තියගේ

සාක්ෂිය මෙහෙයවන ලදී. ඒ අනුව පරීක්ෂණය අවසන් කොට දෙපාර්ශවයට ම අවසන් ලිඛිත සැලකිරීම් ඉදිරිපත් කරන ලෙස දන්වා සිටින ලද අතරතුර පළමුවන පාර්ශවයේ නීතිඥ මහතා 2019.09.06 දිනෙන් මෝසමක් මගින් සැලකර සිටි කාරණයක් මත නැවත බේරුම්කරණ විභාගය සඳහා නියම කොට 2019.07.05 වැනි දිනට කැඳවන ලදී. එදින පළමුවන පාර්ශවය වෙනුවනේ නීතිඥ සාලිය එදිරිසිංහ මහතාත්, දෙවන පාර්ශවය වෙනුවෙන් මධ්‍යම සංස්කෘතික අරමුදලේ වැඩ බලන සහකාර අධ්‍යක්ෂ (නීති) දේවිකා දිසානායක මහත්මියත් සහභාගී වූහ. එහි දී දෙවන පාර්ශවය වෙනුවෙන් ලකුණු කොට ඉදිරිපත් කරන ලද R3 ලේඛනය පිළිබඳ මතු ව ඇති ගැටළුව නීතිඥ සාලිය එදිරිසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද අතර, දෙවන පාර්ශවය වෙනුවෙන් පැමිණ සිටි ආයතනයේ නීති නිලධාරිණිය කරන ලද පැහැදිලි කිරීමෙන් එය නිරාකරණය විය. ඒ අනුව දෙපාර්ශවයට ම අවසන් ලිඛිත සැලකිරීම් 2019.07.15 වැනි දිනට පෙර ගොනු කළයුතු බවට දැනුම්දෙන ලදී.

**බේරුම්කරණ ප්‍රදානය අදාළ කිරීම :**

මෙම යොමුවට අදාළ ව ඇති කාර්මික ආරාවුලට අදාළව සේවය අවසන් කරනු ලැබූ පිරිස ලෙස 285 දෙනෙකුගේ ලැයිස්තුවක් යොමුවට අමුණා තිබුණ ද, මෙම බේරුම්කරණ විභාගයේ දී සහනයක් පතා සෘජු ව හෝ නියෝජනයක් මාර්ගයෙන් පෙනී සිටියේ හැට දෙදෙනෙකු පමණි. පළමුවන පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා ආරම්භයේ සිට ම කියා සිටියේ තමා පෙනී සිටින්නේ පරීක්ෂණයේ දී දිවුරුම් පෙත්සමකින් ඇමුණුමක් ලෙස ඉදිරිපත් කර ඇති සේවය අහිමි වූ පුද්ගලයන් හැට දෙදෙනා සම්බන්ධයෙන් පමණක් බවයි. මේ පිළිබඳ ව බේරුම්කරු විසින් විමසීම් කරන ලද අවස්ථාවල දී කියැවුනේ ඉහතින් සඳහන් කළ 285 ලැයිස්තුවේ සඳහන් අනෙක් අය අතුරින් යම් සංඛ්‍යාවකට මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ ම පසු අවස්ථාවල දී විවිධ රැකියාවන් ලබා දී ඇති බවත්, සමහරුන් වෙනත් රැකියාවන් ලබාගෙන ඇති බවත්, සමහරුන් බේරුම්කරණ විභාගය ගැන උනන්දුවක් නොදක්වන බවත්, ඒ හේතුවෙන් මෙම පරීක්ෂණයට මුහුණ නොදෙන බවත් ය. තම අයිතිවාසිකම් වෙනුවෙන් නියෝජනයක් හෝ පෙනී සිටීමක් නොකරන තැනැත්තන්ට සහනයක් ලබා දීම අපහසු වේ. එම නිසා මෙම බේරුම්කරණ විභාගය අදාළ වන්නේත්, මෙම ප්‍රදානය අදාළ වන්නේ ත් මේ සමග අමුණා ඇති 62 දෙනාගේ පිරිසට පමණක් බව පැහැදිලිවම තීරණය කරමි.

**පළමුවන පාර්ශවයේ ස්ථාවරය :**

- සහනය පතන සේවක පිරිස 2012 මාර්තු මාසය වකවානුවේ දී තමන්ට ලැබුණු ආරාංචියක් මත කොළඹ බෞද්ධාලෝක මාවතේ පිහිටි මධ්‍යම සංස්කෘතික අරමුදල කාර්යාලයේ පවත්වන ලද එහි කම්කරු ගණයේ රැකියාවකට බඳවා ගැනීම සඳහා වූ සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටියහ.

- එකී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් සිටි රසික බණ්ඩාර, පලාපත්වල යන මහත්වරුන් මධ්‍යම සංස්කෘතික අරමුදලේ නිලධාරීන් ය.

- කෙසේ වුවත් එකී සම්මුඛ පරීක්ෂණයේ දී තෝරාගනු ලැබුණු ඔවුන්ට සංරක්ෂණ / කැණීම් සහකාර යන තනතුරට 2012.06.01 දින සිට තත්කාර්යය පදනමෙන් බඳවාගත් බවට පත්වීම් ලිපි නිකුත් කරන ලද අතර, එම ලිපි නිකුත් කරනු ලැබුවේ ''සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් පෞද්ගලික සමාගම'' නමැති ආයතනයක් මගින් ය.

- වැඩ කළ එක් දිනයකට රු. 700 ක වැටුපකට ඔවුන් හිමිකම් ලබන බව එම පත්වීම් ලිපියේ සඳහන් වේ.

- ඔවුන්ට ඉටු කිරීමට සිදුවූ රාජකාරී වූයේ ''කැත්ත උදැල්ලෙන්'' කරන වැඩයි. ඉන් අදහස් කෙරුණේ ඔවුන් කම්කරු ස්වභාවයේ විවිධ කටයුතු ඉටුකරන ලද බවයි.

- 2012 ජුනි මාසයේ දී ඔවුන් වැඩ කළ වැඩබිම්වල සේවයට වාර්තා කරන විටත්, ඒවායේ සේවක පිරිසක් සේවය කරමින් සිටි අතර, තමන් මෙන්ම බඳවාගනු ලැබූ ඔවුන් ද මාස කීපයකට පසු ව මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් සේවයේ ස්ථිර කර තිබුණි.

- නිකුත් කරන ලද පත්වීම් ලිපි අනුව මෙම පත්වීම් සිදු කෙරුණේ මාස 6ක කාලයකට වුව ද, ඔවුන් හැට දෙදෙනා 2012 ජුනි මාසයේ සිට 2015 ඔක්තෝබර් මාසය දක්වා වර්ෂ 3 කුත් මාස 5ක් සේවයේ නියුක්ත කරවන ලදී.

- මෙකී සේවකයින්ට වැටුප් 2012 ජුනි සිට 2015 මැයි දක්වා ඉහත කී සමාගම මගින් ගෙවන ලද අතර, 2015 ජුනි මස සිට 2016 ඔක්තෝබර් දක්වා මාස 5ක කාලය සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් සෘජුව ගෙවන ලදී.

- අවුරුදු තුනයි මාස පහක් වූ මුළු කාලය පුරා ම මෙම සේවකයින් සේවය කළේ මධ්‍යම සංස්කෘතික අරමුදලේ නිලධාරින්ගේ අධීක්ෂණය සහ පාලනය යටතේ වූ අතර, ඔවුන් වැඩබිම් අතර මාරු කිරීම්, ඔවුන්ගේ නිවාඩු අනුමත කිරීම් ආදී ආයතන කටයුතු සියල්ල සෘජුව ම කරනු ලැබුවේ මධ්‍යම සංස්කෘතික අරමුදලේ නිලධාරින් විසිනි.

- මෙහෙයවන ලද සාක්ෂිවලින් තහවුරු කරමින් දක්වූයේ මෙකී සේවකයින්ගේ නියෝජිත පිරිස් 2015 ජුනි සහ 2015 ඔක්තෝබර් අතර කාලය තුළ කීප වතාවක් ම කොළඹට පැමිණ මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හමු වී තමන් සේවයේ ස්ථිර කරන ලෙස ඉල්ලා සිටියහ. ඒ සෑම අවස්ථාවක ම එකී අධ්‍යක්ෂ ජනරාල්වරයා ඊට පිළිතුරු වශයෙන් ඔවුන්ගේ සේවය අවසන් නොකරන බවට පොරොන්දු විය.

- 2015 ඔක්තෝබර් මාසයේ දී මධ්‍යම සංස්කෘතික අරමුදලේ සම්මුඛ පරීක්ෂණයක් පවත්වා මෙම සේවකයින් හැටදෙදෙනාගේ පසුබිමට සමාන පසුබිමක් ඇති සේවකයින් සමහරෙක් තාවකාලික කම්කරුවන් ලෙස තෝරාගෙන රැකියා දෙන ලද නමුත්, මෙම බේරුම්කරණ විභාගයට ඉදිරිපත් වූ සේවකයින් හැටදෙදෙනා ඇතුළු අනෙකුත් සේවකයින් ස්ථිර හෝ තාවකාලික සේවයට පත්කොට නැත. ඒ නිසා ඔවුන්ගේ සේවය අයුක්ති සහගත ලෙස අවසන් කිරීමකට භාජනය කොට ඇත.

- මෙකී සේවකයින් හැටදෙදෙනා ඇතුළු තවත් සේවකයින් පිරිසක් තාවකාලික හෝ ස්ථිර තනතුරුවලට තෝරා නොගැනීමෙන් ඇති වූ පුරප්පාඩු පිටස්තර අයගෙන් පුරවනු ලැබිණි.

- ඉවත් නොකොට රඳවාගත් සේවකයින් සහ තාවකාලික කම්කරු පත්වීම් අලුතෙන් ලැබූ සේවකයින් ඉන් පසු ව ද ඉටු කළේ මෙහි සඳහන් හැටදෙදෙනා ඇතුළු ව ඉවත් කරනු ලැබූ සේවකයින් විසින් කලින් ඉටු කරන ලද ස්වභාවයේ රාජකාරී කටයුතු ම ය.

දෙවන පාර්ශවයේ ස්ථාවරය :

- පළමු වන පාර්ශවය ලෙස පෙනී සිටින සේවක පිරිස කිසිදු අවස්ථාවක දී ඔවුන්ගේ ශ්‍රමය සෘජු ව ම දෙවන පාර්ශවය ලෙස නම් කර ඇති මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත ලබා දී නැත.

- පළමුවන පාර්ශවයේ සේවකයින්ගේ සේවය 2012.06.01 දින සිට 2015.05.31 දක්වා සෘජුව ම ලබා ගත්තේ සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් පෞද්ගලික සමාගම විසිනි. ඒ හේතුව නිසා කිසි විටෙක දෙවන පාර්ශවය පළමු වන පාර්ශවයේ සේවායෝජකයා නොවීය. ඒ නිසා පළමුවන පාර්ශවයේ සඳහන් සේවකයින්ගේ සේවා සමාප්තිය පිළිබඳව දෙවන පාර්ශවය, එනම් වගඋත්තරකාර පාර්ශවය ලෙස නම් කර ඇති මධ්‍යම සංස්කෘතික අරමුදලට සම්බන්ධතාවක් ඇති වන්නේ නැත.

- සේවකයින්ගේ සේවය අවසන් කිරීම් සම්බන්ධයෙන් තීරණයක් කිරීමට බේරුම්කරණයට අධිකරණ බලයක් නොමැති අතර, ඒ සඳහා අධිකරණ බලය හුදෙක් ම ඇත්තේ කම්කරු විනිශ්චය සභාවට ය.

නිරීක්ෂණ සහ නිගමන :

- කලින් ද අවධාරණය කරන ලද පරිදි මෙම ප්‍රදානය මේ සමඟ ඇති ඇමුණුමේ සඳහන් සහනය පතන සේවකයින් හැට දෙදෙනාට පමණක් හිමිවිය යුතු බව නිගමනය කරමි.

- දෙවන පාර්ශවයේ අවසන් ලිඛිත දේශනයේ අවධාරණය කර ඇති ප්‍රධාන කරුණු දෙකකි. එනම්,

1. මෙම සේවකයින් දෙවන පාර්ශ්වය විසින් සේවයේ නියුක්ත කරවන ලද ''සේවකයින්'' නොවන බව, සහ

2. මෙම කාර්මික ආරාවුල සේවකයින්ගේ සේවය අවසන් කිරීමකට අදාළ වන්නක් නිසා එය බේරුම්කරණයෙන් නිරවුල් කිරීමට බේරුම්කරණයට අධිකරණ බලයක් නොමැති බව,

   මෙම කරුණු දෙකම බේරුම්කරණ යොමුව සම්බන්ධ මූලික විරෝධතා ස්වභාවයේ ඒවා ය. එකී කරුණු ඉස්මතු කොට මූලික විරෝධතා ලෙස විභාගය ආරම්භයේ ඉදිරිපත් කිරීමට දෙවන පාර්ශවයට අවස්ථාව තිබුණි. ඒවා කිසිවක් විභාගය ආරම්භයේ දී හෝ අතරතුර මූලික විරෝධතා වශයෙන් ඉදිරිපත් වුනේ නැත.

කෙසේ වුවත් විභාගයේ සාක්ෂි මෙහෙයවීම මගින් දෙවන පාර්ශවය මෙම සහනය පතන සේවකයින් කිසිවෙකු දෙවන පාර්ශ්වය ලෙස නම්කොට ඇති මධ්‍යම සංස්කෘතික අරමුදලේ සේවකයින් නොවන බවත්, ඔවුන්ගේ සේවායෝජකයා සීමාසහිත සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් පෞද්ගලික සමාගම බවටත් ඒත්තු ගැන්වීමට වෑයම්කොට ඇත. අනෙක් අතට පළමුවන පාර්ශවය තහවුරු කිරීමට උත්සහ ගෙන ඇත්තේ යම් පරිපාලන වැඩ පිළිවෙලක් සඳහා පුද්ගලික සමාගමක් ස්ථාපිත කොට ඒ නමින් මෙම සේවකයින් බඳවා ගත්ත ද එකී සේවකයින්ගේ සැබෑ සේවායෝජකයා මධ්‍යම සංස්කෘතික අරමුදල බවටයි. එම නිසා මෙම පරීක්ෂණය පුරාවට ම හබ කෙරුණු ප්‍රධාන විසඳිය යුතු කරුණක් වූයේ දෙවන පාර්ශවය ලෙස නම් කර ඇති මධ්‍යම සංස්කෘතික අරමුදල මෙම සේවකයින්ගේ සැබෑ ''සේවායෝජකයා'' වන්නේ ද නැද්ද යන්න නිර්ණය කිරීමය.

- මෙහි සහනය පතන පළමුවන පාර්ශ්වයේ අය මධ්‍යම සංස්කෘතික අරමුදලේ ''සේවකයින්'' (Employee) ද නැතිනම් ''ස්වාධීන කොන්ත්‍රාත්කරුවන්'' (Independent Contractor) ද යන්න නීති තර්කයක් ලෙස නිරවුල් කරගැනීම මෙහි දී අවශ්‍ය වේ.

- දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි ජ්‍යෙෂ්ඨ නීතිඥ මහතා සාක්ෂි විභාගයේ බොහෝ අවස්ථාවල ඊට නැඹුරු වී මෙම සේවකයින් මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් සේවයේ යොදවන ලද එහි සේවකයින් නොව නියෝජිත ආයතනයක් මගින් යොමු කරන ලද සේවක පිරිසක්, එනම් එහි ස්වාධීක කොන්ත්‍රාත්කරුවන් පිරිසක් ලෙසට කරුණු ඉස්මතු කිරීමට සාක්ෂි මෙහෙයවීමක් දක්නට ලැබුණි. ඔවුන් සේවකයින් ද නැතිනම් ස්වාධීන කොන්ත්‍රාත්කරුවන් ද යන්න නිර්ණය කිරීමට දෙපාර්ශවය විසින් මෙහෙයවන ලද සාක්ෂි සහ ඉදිරිපත් කරන ලද කරුණු ආශ්‍රයෙන් මතු කළ හැකි කරුණු කීපයකි.

  - සීමාසහිත සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් පෞද්ගලික සමාගම නමින් සංස්කෘතික සහ කලා කටයුතු අමාත්‍යාංශය යටතේ පෞද්ගලික සමාගමක් බිහිකොට ඇත. එය A2 ලෙස ලකුණු කළ ලේඛනය ඇතුළු ලේඛන රාශියකින් තහවුරු වේ.
  - එය ස්වාධීන ආයතනයක් ලෙස පැවැති බවට ලේඛන උපයෝගී කරගනිමින් පෙන්නුම් කරනු ලැබුවත් අමාත්‍යාංශය යටතේ ම පවත්නා මධ්‍යම සංස්කෘතික අරමුදල සමග බැඳුණු එකක් බවට කරුණු තහවුරු වී ඇත.

  - මෙම සේවකයින් ඉහත කී සමාගමට බඳවා ගැනීම සඳහා පවත්වනු ලැබූ සම්මුඛ පරීක්ෂණවල දී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් ලෙස සේවය කළ අය අතර මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් ගාමිණී අධිකාරී මහතා සිටි බව 2018.10.09 දින පැවැති බේරුම්කරණ විභාගයේ දී සාක්ෂිකරු සිංහලගේ සාගර සඳරුවන් රණසිංහ (පිටු අංක 04 සහ 05 හි) ප්‍රතිඥා පිට සාක්ෂි දී ඇත. 2019.05.28 වැනි දින ඔහුගෙන් අසන ලද හරස් ප්‍රශ්නවල දී ඊට අභියෝගයක් එල්ල වී නැත.

  - 2012 වර්ෂයේ දී පැවැති එකී සම්මුඛ පරීක්ෂණය පැවැත්වූ ස්ථානය කොළඹ බෞද්ධාලෝක මාවතේ පිහිටි මධ්‍යම සංස්කෘතික අරමුදල් කාර්යාලය බවට බොහෝ සාක්ෂි වලින් කියවිණ. සේවය අහිමි වූ සේවකයෙකු වන එල්. ඒ. ඩී. දිසානායක යන අය 2018.05.18 වැනි දින සාක්ෂි දෙමින් (කා.ස.පිටු. අංක 04) මෙසේ කියා ඇත.

    ''ප්‍ර: මෙම පරීක්ෂණ තිබුණේ කොහේ ද?
    ''පි: මධ්‍යම සංස්කෘතික අරමුදල් කාර්යාලයේ.
    ''ප්‍ර: කාර්යාලය කොහේද තියෙන්නේ?
    ''පි: බෞද්ධාලෝක මාවත, කොළඹ 07.''

සෑම සාක්ෂිකරුවෙකුගෙන් ම හරස් ප්‍රශ්න විමසීමේ දී මෙම සම්මුඛ පරීක්ෂණය පැවැත්වූ ස්ථානය මධ්‍යම සංස්කෘතික අරමුදල් කාර්යාලය නොව අතපත්තු ගොඩනැගිල්ලේ පිහිටි සීමාසහිත සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් පෞද්ගලික සමාගම් කාර්යාලය බවට තර්කයක් ගොඩනැගීම සඳහා දෙවන පාර්ශ්වය උත්සාහයක් ගෙන ඇත. එහෙත් එල්. ඒ. ඩී. දිසානායක සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේ දී ලැබුණේ ද එම පිළිතුර මය. 2018.07.01 දින දෙවන පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතාගේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් (කා.ස. පිටු අංක 22) සාක්ෂිකරු මෙසේ කියා සිටී.

''ප්‍ර: සම්මුඛ පරීක්ෂණය පවත්වපු ස්ථානය මොකක් ද?
''උ: බෞද්ධාලෝක මාවතේ මධ්‍යම සංස්කෘතික අරමුදල් ගොඩනැගිල්ල.
''ප්‍ර: ස්ථානය මොකක් ද ? අතපත්තු ගොඩනැගිල්ල නේ ද?
''උ: නෑ. බෞද්ධාලෝක මාවතේ මධ්‍යම සංස්කෘතික අරමුදල් කාර්යාලයේ දී.
''ප්‍ර: තමුන් කියන්නේ අරමුදල් කාර්යාලයේ පැවැත්වූවා කියා ද?
''උ: ඔව්.
''ප්‍ර: එතකොට පෞද්ගලික සමාගම කොහේ ද තියෙන්නේ ?
''උ: ඒක තියෙන දිහා මම දන්නේ නැහැ.''

- අංක ඒ/14/2017 යොමුව යටතේ විභාගය පවතිද්දී 2017.07.04 වැනි දින (කා.ස. පිටු අංක 03 සහ 04) සාක්ෂි දුන් එච්. බී. ඩී. එම්. කේ. කුමාරිහාමි නැමැති සාක්ෂිකාරිය කියා ඇත්තේ තමන් සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටියේ බෞද්ධාලෝක මාවතේ අතපත්තු ගොඩනැගිල්ලේ පිහිටා තිබුණු මධ්‍යම සංස්කෘතික අරමුදල් කාර්යාලයේ බව කියා ඇත. එම සාක්ෂිය තුළ පරස්පර කරුණු ඇතුළු වුවත් 2018.04.23 (කා.ස. පිටු අංක 03 සහ 04) සාක්ෂිකාරියගෙන් කරන ලද නැවත සාක්ෂි විමසීමේ දී එය නිවැරදි කරමින් තමා සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටියේ බෞද්ධාලෝක මාවතේ පිහිටි මධ්‍යම සංස්කෘතික අරමුදල් කාර්යාලයේ දී බවට සාක්ෂි දී ඇත. පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි දුන් සාක්ෂිකරුවන් සියලු දෙනා ම පාහේ කියා සිටි පරිදි 2012 වර්ෂයේ පැවැති සම්මුඛ පරීක්ෂණයෙන් මධ්‍යම සංස්කෘතික අරමුදල් කාර්යාලයේ දී, මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්ය මණ්ඩලයට අයත් නිලධාරින් විසින් පවත්වන ලද්දේ ය යන්න දෙවන පාර්ශ්වයට බිඳ හෙළිය නොහැකි විය.

- තවද පළමු පාර්ශ්වය මෙහෙය වූ සියලු ම සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවලින් කියවුණේ ඔවුන් සේවය කළ වැඩබිම් මධ්‍යම සංස්කෘතික අරමුදලට අයත් ඒවා බවත්, ඒවා භාරව කටයුතු කළේ මධ්‍යම සංස්කෘතික අරමුදලේ නිලධාරීන් බවත්, සේවක පරිපාලනය සහ වැඩ අධීක්ෂණය (2018.09.14) දින කා.ස. පිටු අංක 08) සම්පූර්ණයෙන් ම සිදුකෙරුණේ ඔවුන් අතින් ම බවත් ය. මෙම සේවකයින්ගේ නිවාඩු අනුමත කරන ලද්දේ වැඩබිම් භාර ව සිටි මධ්‍යම සංස්කෘතික අරමුදලේ නිලධාරින් විසින් ය. (ඒ/14/2017 ගොනුව යටතේ පැවැති විභාගයේ 2017.07.04 දින කා. ස. පිටු අංක 04).

- 2018.05.18 වෙනි දින කා.ස. පිටු අංක 11 සහ 12 පිටුවල සාක්ෂි දෙමින් කියා සිටියේ A8 ලෙස ලකුණු කළ ලේඛනය මගින් එල්. ඒ. ඩී. දිසානායක නැමැත්තා දඹදෙණිය ව්‍යාපෘතියේ සිට නාථගනේ ව්‍යාපෘතියට ස්ථාන මාරු කිරීම කර ඇත්තේ මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් බව ය. එකී ස්ථාන මාරු ලිපිය එහි අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට අධ්‍යක්ෂ (පාලන) පුරා විද්‍යාඥ ගාමිණී දොඩංවල මහතා විසින් අත්සන් කර ඇත.

- පළමුවන පාර්ශ්වය තම වාසියට ගෙන එන ලද මෙම කරුණු දෙවන පාර්ශ්වය විසින් සාක්ෂිකරුවන්ගෙන් කරන ලද හරස් ප්‍රශ්න විමසීම්වල දී වත්, දෙවන පාර්ශ්වය විසින් මෙහෙයවන ලද සාක්ෂිවලින් වත් බිඳ හෙළීමට සමත් වී නැත.

- ඒ අනුව සේවකයා ද නැතිනම් ස්වාධීන කොන්ත්‍රාත්කරු ද යන්න නිර්ණය කිරීමට අදාළ වන පාලන පරීක්ෂණය (Control test) සිද්ධාන්තය තුළට බහා බලන විට මෙහි සහනය පතන අය මධ්‍යම සංස්කෘතික අරමුදලේ සේවකයින් බවට මම නිශ්චිතව නිගමනය කරමි.

- ඔවුන් ඉහත කී සංරක්ෂණය / කැණීම් සහකාර යන තනතුරට පත් කරමින් පත්වීම් ලිපි නිකුත් කර ඇත්තේ සීමාසහිත සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් පෞද්ගලික සමාගම විසිනි. A2 ලෙස ලකුණු කළ එක් සේවකයෙකුට නිකුත් කළ පත්වීමේ ලිපියක් ආදර්ශයක් ලෙස ඉදිරිපත් කරමින් එය තහවුරු කරන ලදී. A7 සහ R2 වශයෙන් දෙපාර්ශවය විසින් ම ලකුණු කර ඇති පුහුණු සංරක්ෂණ / කැණීම් සහායකයින් සැපයීමේ කොන්ත්‍රාත් ගිවිසුම මගින් මධ්‍යම සංස්කෘතික අරමුදලේ වයඹ ව්‍යාපෘතීන් හි වැඩිබිම්වලට අවශ්‍ය වන සේවකයින් සැපයීමේ කොන්ත්‍රාත්තුවක් අත්සන් කරනු ලැබ ඇත. මෙහි දී නිරීක්ෂණය වූ කරුණක් වුයේ එම කොන්ත්‍රාත් ගිවිසුම පදනම් කරගෙන සීමාසහිත සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් පෞද්ගලික සමාගම විසින් සේවකයින් බඳවාගෙන පත්වීම් ලිපි නිකුත් කොට මධ්‍යම සංස්කෘතික අරමුදල් වැඩබිම්වල සේවයට යොමු කරන ලද බවයි. මෙම ගිවිසුම ගැන සේවකයින් නොදැන සිටි බව ද පරීක්ෂණයේ සාක්ෂිවලින් හෙළි විය. මෙම කරුණු වලින් නිරීක්ෂණය වූයේ සේවකයින් පිරිසක් බඳවාගෙන නඩත්තු කිරීමේ වගකීමකින් නිදහස් වී එය පරිපාලන ක්‍රියාමාර්ගයක් වශයෙන් සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතේ ම සීමාසහිත සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් පෞද්ගලික සමාගම නැමති සමාගම නිර්මාණය කොට, ඒ හරහා සේවකයින් බඳවාගෙන සේවයේ යොදවා ගත් බවයි.

පරීක්ෂණ විභාගය පුරාවටම කියවුණු සියලු ම කරුණු ඉතා පරීක්ෂාවෙන් බැලූ පසු සැබෑ වශයෙන් සහනය පතන සේවකයින්ගේ සේවායෝජකයා වන්නේ මධ්‍යම සංස්කෘතික අරමුදල බව නිගමනය කරමි.

එම කරුණ ඒ ආකාරයෙන් ම නිගමනය කිරීමට හේතු වන තවත් ඉතා ම වැදගත් සාධකයක් වන්නේ වසර තුනක් සමාගම මගින් වැටුප් ගෙවීමෙන් පසු ව 2015.06.01 සිට 2015.10.31 දින දක්වා මාස පහක කාලය තුළ දී ඔවුන් වෙත සෘජු ව ම මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් වැටුප් ගෙවා එහි සෘජු සේවකයින් ලෙස සේවයේ යොදවනු ලැබීමයි. මෙම සේවකයින් සම්බන්ධයෙන් මධ්‍යම සංස්කෘතික අරමුදලට තිබුණු අත්හැරිය නොහැකි බැඳීම ඉන් මනා ව පෙන්නුම් කෙරේ.

මෙම සේවකයින් තමන්ට සේවය අහිමි වන බවට යම් සැකයක් ඇති වීමේ හේතුවෙන් මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රධාන කාර්යාලයට නියෝජිත පිරිස් එවා එහි අධ්‍යක්ෂ ජනරාල්වරයා හමු වී මෙම සේවක පිරිස ස්ථිර කරන ලෙස ඉල්ලා සිටි බවත්, එහි දී අධ්‍යක්ෂවරයා ඔවුන් කිසිවෙකුගේ සේවය අහිමි නොකරන බවට ප්‍රතිඥා දුන් බවත්, සාක්ෂිවලින් කියවුණි. හරස් ප්‍රශ්න අසා අධ්‍යක්ෂ ජනරාල් විසින් එවැනි පොරොන්දුවක් නොදුන් බවට යෝජනා කිරීම් කරනු ලැබුවත් පළමුවන පාර්ශවය පෙන්නුම් කළ එම කාරණය සාර්ථක ව බිඳ හෙළීමට දෙවන පාර්ශවය සමත් වී නොමැත.

කෙසේ හෝ මධ්‍යම සංස්කෘතික අරමුදල 2015 වර්ෂයේ දී දන්වීම් මගින් ප්‍රසිද්ධ කොට මධ්‍යම සංස්කෘතික අරමුදලේ වැඩබිම් වලට සේවකයින් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ඇත. එම සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන්ට ලකුණු ලබා දිය යුතු වූ පටිපාටිය, අධ්‍යාපන අමාත්‍යාංශයේ (සංස්කෘතික විෂය ද අධ්‍යාපන අමාත්‍යාංශය යටතේම පැවතුණි.) ලේකම් වෙනුවෙන් අතිරේක ලේකම් (පාලන) විසින් මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් අමතා "තාවකාලික කම්කරුවන් බඳවාගැනීම සඳහා වන සම්මුඛ පරීක්ෂණය" යන මැයෙන් 2015.10. ..... ලෙස දිනයක් නොමැති ව වර්ෂය සහ මාසය පමණක් ඇති ව එවන ලද ලිපියෙන් දන්වා තිබුණි. එම ලිපිය මෙම පරීක්ෂණයේ දී නගමනවලට එළඹීමේ දී ඉතා වැදගත් වන්නක් වන අතර එය A11 වශයෙන් පළමු පාර්ශවයෙනුත් R3 වශයෙනුත් දෙවන පාර්ශවයෙන් ලකුණු කොට දීර්ඝ වශයෙන් සාක්ෂි විභාගයට ලක් වූවකි. 2019.05.28 වන දෙවන පාර්ශවය වෙනුවෙන් මෙහෙයවන සාක්ෂියේ දී ද (කා.ස.පිටු අංක : 12) තහවුරු කොට ඉදිරිපත් වුණේ 2015 වර්ෂයේ නොවැම්බර් 27 සහ 28 දිනවල R3 හි සඳහන් ලකුණු දීමේ පටිපාටියට අනුකූලව මධ්‍යම සංස්කෘතික අරමුදලට තාවකාලික කම්කරුවන් බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ බවත්, ඊට පෙනී සිටීමට පළමුවන පාර්ශවයේ ඉල්ලුම්කරුවන් ඇතුළු ඉහත කී සීමාසහිත සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් පෞද්ගලික සමාගම යටතේ සේවය කළ සේවකයින්ටත් අවස්ථාව දෙනු ලැබ එකී සම්මුඛ පරීක්ෂණයේ දී ඔවුන් අතුරින් යෝග්‍යතාව ලැබූ 135 දෙනෙකුට අදාළ පත්වීම් ලබා දෙන ලද බවත් ය. අනෙක් පිරිසට පත්වීම් නොලැබුණේ ඔවුන් එකී සම්මුණ පරීක්ෂණයේ ලකුණු දීමේ පටිපාටියට අනුව යෝග්‍යතාව තහවුරු නොකළ නිසා බව ද දෙවන පාර්ශවයේ ස්ථාවර විය.

මෙම ලකුණු දීමේ පටිපාටිය සම්මුඛ පරීක්ෂණයට අදාළ කරගැනීම බලවත් ප්‍රශ්නයක් උද්ගත කරයි. මෙම සම්මුඛ පරීක්ෂණය පැවැත්වුණේ 2015 ඔක්තෝබර් මාසයේ අග හරියේ යන්න සෑම සාක්ෂිකරුවෙකුගෙන් ම කියවුණු කරුණකි. විශේෂයෙන් පළමුවන පාර්ශවය වෙනුවෙන් සේවය අභිමිවූවෙකු වන එල්. ඒ. ඩී. දිසානායක නැමැත්තා 2018.05.18 වෙනි දින තම මූලික සාක්ෂිය දෙමින් එදින 18 වැනි සාක්ෂි සටහන් පිටුවේ දී මෙසේ කියා ඇත.

"ප්‍ර: මොන වගේ සම්මුඛ පරීක්ෂණයකට ද ඉදිරිපත් වුණේ? තමුන්ගේ සේවය ස්ථිර කර ගැනීමේ අරමුණින් ගියේ?
පි: ඔව්
ප්‍ර: 2015 ඔක්තෝබර් කවදා විතර ද ගියේ ?
පි: 27 වගේ ''

දෙවන පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා 2018.09.05 වැනි දින (පිටු අංක 18) සාක්ෂිකරු දිසානායකගේ හරස් ප්‍රශ්න විමසීමේ දී මේ කරුණ ගැන හරස් ප්‍රශ්න අසා ඇතත් 2015 ඔක්තෝබර් 27 වැනි දින හෝ 2015 ඔක්තෝබර් මාසයේ වෙනත් දිනයෙක එකී සම්මුඛ පරීක්ෂණය පැවැත්වූයේ නැත යන්න තහවුරු කිරීමට උත්සාහයක් ගෙන නැත.

මධ්‍යම සංස්කෘතික අරමුදලට තාවකාලික වශයෙන් සේවකයින් බඳවා ගැනීම සඳහා සේවකයින් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ දෙවන පාර්ශවය විසින් R1 වශයෙන් ලකුණු කළ දැන්වීම නිකුත් කර ඇත්තේ 2015.10.12 වැනි දින දී බව තහවුරු වේ. එහි සඳහන් වන්නේ අදාළ සම්මුඛ පාරීක්ෂණය 2015.10.27 සහ 28 යන දිනයන්හි පවත්වනු ලබන බවයි. ඒ කාරණයෙන් සාක්ෂිකරු දිසානායක විසින් තමා සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටියේ 2015.10.27 දින දී ය යන කරුණ සනාථ වේ.

දෙවන පාර්ශවයේ අවසන් ලිඛිත සැළකිරීම්වල අංක : 2.5 සහ 2.6 යටතේ එකී සම්මුඛ පරීක්ෂණයන් 2015.10.27 සහ 28 යන දිනයන් හි පැවැත්වූ බවත්, එකී සම්මුඛ පරීක්ෂණයේ දී R3 සඳහන් නිර්නායකයන් භාවිතා කළ බවත් දෙවන පාර්ශවය පිළිගෙන ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලිපි ශීර්ෂය යටතේව වර්ෂය සහ මාසය පමණක් 2015.10. .............. යනුවෙන් යොදා දිනයක් රහිත ව මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයට 2015.11.15 වෙනි දින දීත්, එහි අධ්‍යක්ෂ (පාලන) ගේ කාර්යාලයට 2015.11.20 වැනි දින දීත් ඉහත කී ලකුණු දීමේ ක්‍රමය ඇතුළත් ලිපිය (A11) ලැබුණේ නම් එම ලකුණු දීමේ ක්‍රමය 2015 ඔක්තෝබර් මාසයේ අග දී පැවැත්වූ මෙම සම්මුඛ පරීක්ෂණයට යොදා ගත්තේ කෙසේ ද යන්න සිතා ගත නොහැක.

තව ද එම A11 හි ඇතුළත් ලකුණු දීමේ පටිපාටිය මගින් අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු 40 ක් ද, වෘත්තීය සුදුසුකම් සඳහා ලකුණු 25 ක් ද, සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු 35 ක් ද වශයෙන් ලකුණු ලබා දිය යුතු බව දක්වා ඇත. එහෙත් A 14 වශයෙන් ලකුණු කරනු ලැබූ උධෘත වලිනුත්, බේරුම්කරණ විභාගයේ දී ඉදිරිපත් කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණයේ මුළු ලකුණු ලැයිස්තු වලිනුත් පැහැදිලිව පෙනී යන්නේ අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, වර්තමාන රැකියාව හා පළපුරුද්ද, සහ සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු වශයෙන් ශීර්ෂ 4 ක් යටතේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි අයට ලකුණු ලබා දී ඇති බවයි. ඒ අනුව ඉහතින් සඳහන් කළ අමාත්‍යාංශයෙන් අනුමත කරනු ලැබූ ලකුණු දීමේ පටිපාටිය දෙවන පාර්ශවය විසින් සම්මුඛ පරීක්ෂණයේ දී අනුගමනය කොට නොමැති බව පැහැදිලි වේ.

එසේ ම දින 2 ක් ඇතුළත අයදුම්කරුවන් විශාල සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට භාජනය කොට ඉහත කී ශීර්ෂ යටතේ සියුම්ව ලකුණු දීමට හැකිවන්නේ කෙසේ ද යන්න ප්‍රශ්නයකි. තෝරා ගැනීම සඳහා කඩඉම් ලකුණු සංඛ්‍යාව 50 ක් වූ අතර, ඊට ලකුණු කීපයක් අඩු අය ද නොතේරී ගොස් ඇත. ඒ අනුව මෙම සම්මුඛ පරීක්ෂණය විධිමත් ව පවත්වන ලද්දක් ද යන්න කිසිසේත් පිළිගත නොහැක.

මෙම සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දෙන ආකාරයන් සහ එහි ඇති විෂමතා සහ ඌනතා පිළිබඳ ව පළමුවන පාර්ශවය විසින් දිගින් දිගටම හබ කරන ලද අතර ඉදිරිපත් කරන ලද කරුණු අනුව සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දීමේ දී සාධාරණයක් ඉටු වී නොමැති බවට මම ද දැඩි සේ එකඟ වෙමි.

තාවකාලික කම්කරු ඇබෑර්තු වන මෙම රැකියාවට සේවකයින් තෝරා ගැනීමේ දී වෘත්තීය සුදුසුකම් යටතේ ලකුණු දීමට ඇති යෝග්‍යතාව මනින්නේ කෙසේ ද යන්න පැහැදිලි නැත.

R3 ලේඛනයේ ලකුණු දීමේ ක්‍රමයේ දී විස්තරාත්මක පිළිවෙලක් දී ඇත්තේ අධ්‍යාපන සුදුසුකම් යටතේ දී පමණි. සාක්ෂි විභාගයේ දී කියවුණු කරුණක් වනුයේ 2015 ඔක්තෝබර් මාසයේ දී සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට පෙර එහි සේවයේ යෙදී නොසිටි අලුත් සේවකයින් පිරිසක් මේ මගින් බඳවාගෙන තිබුණු බවයි. තාවකාලික කම්කරු රැකියාවකට බඳවා ගැනීමේ දී වසර 3 1/2 ක් පමණ එම රැකියාවේ ම කටයුතු කළ පුද්ගලයෙකුගේ යෝග්‍යතාව අභිබවා අලුත් සේවකයෙකුගේ යෝග්‍යතාව සාධාරණය කළ හැකි වන්නේ කෙසේ ද යන්න ප්‍රශ්නයකි. සාක්ෂි විභාගයේ දී කියවුණු තවත් කරුණක් වනුයේ 2012 වර්ෂයේ දී මෙම සේවකයින් සේවයට බැඳෙන අවස්ථාව වන විට එහි සේවය කළ සේවකයින් පසු අවස්ථාවල ස්ථිර තනතුරවලට පත් කළ නිසා තමන්ට ද සේවයේ ස්ථිරතාවක් ලබා ගැනීමේ සාධාරණ අභිලාෂයක් තිබුණු බවයි. ඒ අනුව මෙහි දී දෙවන පාර්ශවය සාධාරණ ව කටයුතු කළේ නම් කළ යුතු ව තිබුණේ මූලික සුදුසුකම් නොමැතිකම්, විනය හේතු වැනි කරුණු මත ඉවත් කළ යුතු අය හැර ඉතිරි පෙර සේවකයින් බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණයේ දී ප්‍රමුඛතාව ලබා දීම ය. ඉහත කරුණු පදනම් කොට ගෙන සමස්ථ බේරුම්කරණය විභාගයේ දී නිරීක්ෂණය සහ නිගමනය කළ කරුණු පදනම් කරගෙන පහත සඳහන් ප්‍රදානයන් කරනු ලබේ.

### ප්‍රදානය

1. මෙම ප්‍රදානය යොමුවට අමුණා තිබුණු ලැයිස්තුවේ සඳහන් නම් අතුරෙන් මේ සමග අමුණා ඇති ලැයිස්තුවේ ඇතුළත් සේවය අහිමි කරන ලද සේවකයින් 62 දෙනා පමණක් 2015.11.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි තාවකාලික කම්කරු තනතුරුවලට පත් කළ යුතු ය.

2. ඔවුන් 62 දෙනාට ඔවුන් අඛණ්ඩ ව සේවයේ යෙදී සිටියේ නම් ලැබිය යුතු ව තිබුණු උසස්වීම් හා සේවයේ ස්ථිරභාවය එක් එක් සේවකයාට වෙන් වෙන් වශයෙන් පෞද්ගලික වන සේ ලබා දිය යුතු ය.

3. එකී සේවකයින් 62 දෙනාට 2015.11.02 දින සිට ඔවුන් සේවයේ පිහිටුවන දින දක්වා හිඟ වැටුප් මාසිකව ගණනය කොට ගෙවිය යුතු ය. (හිඟ වැටුප් ගණනය කළ යුතු ආකාරය : එක් එක් සේවකයා මසකට දින 20 ක් සේවය කළා සේ සළකා දිනකට රු. 700/- ක් බැගින් මසකට රු. 14,000/- වශයෙන්)

4. සියලු පත්වීම් සහ උසස්වීම් මෙම ප්‍රදානයේ සිට මාසයක් ඇතුළත සිදුකොට ඒ බව දකුණු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට දැන්විය යුතු ය.

5. ඉහත 3 ප්‍රදානයේ සඳහන් හිග වැටුප් ගණනය කොට මාස 03 ක් ඇතුළත දකුණු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.

6. මෙම ප්‍රදානය අමුණා ඇති එකී ලැයිස්තුවේ සඳහන් සේවකයින් 62 දෙනාට පමණක් ම සීමා විය යුතු ය.

එස්. විරිතමුල්ල
බේරුම්කරු
2019.11.29 දින කාර්මික අධිකරණයේ දී ය.

| අංකය | නම | ලිපිනය | හැඳුනුම්පත් අංකය |
|---|---|---|---|
| 01. | එස්.පී.අනෝමා ශ්‍යාමලී කුමාරි | බලගොල්ලාගම, බලල්ල. | 775164263V |
| 02. | ආර්.එම්.දීපිකා ප්‍රියානි රාජගුරු | මැටියග්ගම, කරඹෑ, මහව. | 925431141V |
| 03. | එච්.බී.බී.එම්.කේ. කුමාරිහාමි | නො.02, දළදාගම, මහව. | 708633160V |
| 04. | බී.එම්.ජී.කේ. බස්නායක | ඩිපෝ පාර, දළදාගම | 707241764V |
| 05. | පී.එම්. දයාරත්න | කරුවලගහවත්ත, මහව. | 712971096V |
| 06. | පී.එච්. චිත්‍රා චාන්දනී අමරසිරි | පාසල ඉදිරිපිට නිවස, කඩවලේ, බලල්ල. | 797421499V |
| 07. | සී.ජේ.එම්. ගුණපාල දිසානායක | දොඩම්ගොල්ලේගම, සිරිසෙතගම, නිකවැරටිය. | 661571683V |
| 08. | ඩබ්.එම්. චරිත් ලක්ෂාන් විජේකෝන් | අංක 221, තලාව, සියඹලංගමුව, මහව. | 912472272V |
| 09. | ආර්.එම්.බී. නයනා මල්කාන්ති කුමාරි | අටවරල, මහව. | 735974173V |
| 10. | එස්.ජී.එම්. ගංගා තරංගනී | හැලෝගම, නාගොල්ලාගම. | 935151562V |
| 11. | ඩී.එම්. චිත්‍රා නන්දනී | හැලෝගම, නාගොල්ලාගම. | 197775702393 |
| 12. | ඩී.එම්. තිලිණි ප්‍රියදර්ශනී | මලීගම, මහව. | 917832439V |
| 13. | ඩබ්.ජී. නිල්මිණි නොළුම්දෙනිය | ගුරුන්නැහැලැගම, මහව. | 827191787V |
| 14. | අයි.එම්. චම්පිකා දීපානි බණ්ඩාර | හේනෙපොල, උහුමීය. | 708522586V |
| 15. | ආර්.එම්. ජයසුන්දර | මල් අස්න, පොල්පිතිගම. | 680372071V |
| 16. | ජේ.එම්. නන්දසිරි ජයලත් | ගොඩහිටිගම, මහව. | 701173724V |
| 17. | ජේ. එම්. සංජය කුමාර ජයවර්ධන | දුනුපතගම, මහව. | 722180860V |
| 18. | එච්.එම්. තුෂාර සංජීවන හේරත් | 199, අබකොලවැව, අඹන්පොල. | 812211935V |
| 19. | ආර්.එම්. නවරත්න බණ්ඩා | කිරිමැටියාව, මහව. | 196111302999 |
| 20. | ඩී.එම්. සරත් කුමාර හේරත් | මීගස්වැව, කෝන්වැව. | 743301749V |
| 21. | ආර්.ඩී. ලලිත් සංජීව | අංක 07, අබකොළවැව, අඹන්පොල. | 861602397V |
| 22. | ආර්.ඩී. මධුසංඛ ප්‍රදීප් වික්‍රමසිංහ | නො.25, වෙලේ පාර, පලුගොල්ල, හිරියාල, අඹගස්වැව. | 901371300V |
| 23. | එන්.පී. ජනරංජන රාජසිංහ | නො.196, අබකොළවැව, අඹන්පොල. | 880100556V |
| 24. | ජේ.එම්. ජීවන්ත සුනෙත් ප්‍රේමරත්න | පිදිවිල්ල, කරඹෑ, මහව. | 910260277V |
| 25. | ටී.ආර්. සංජීව තෙන්නකෝන් | වැව ඉහළවත්ත, රොලව, අඹන්පොල. | 872250093V |
| 26. | එච්.එම්. හේරත් ජයසිංහ | යද්දිගම, කෝන්වැව. | 660024115V |
| 27. | එච්.එම්. සම්පත් නුවන් බණ්ඩාර | තල්පත්වැව, පොල්පිතිගම. | 860713128V |
| 28. | සී.ජී.එච්.එම්. සමන් ආලෝක බංඩාර | 39, ගොඩහිටිගම, යාපහුව, මහව. | 831283254V |
| 29. | ඩබ්.එම්. ලතා වාසල | මඩගල්ල පාර, තළංගෙදර, මහව. | 637270257V |

| අංකය | නම | ලිපිනය | හැඳුනුම්පත් අංකය |
|---|---|---|---|
| 30. | කේ.එම්. කුසුමාවතී | මොරගස්වැව, කෝන්වැව. | 718172306V |
| 31. | එච්.එම්.කේ. ශ්‍රීපාලි කරුණාතිලක | උඩවෙළවත්ත, දෙඹදෙණිය. | 755263320V |
| 32. | ආර්.ඩී. ජයන්ත ජයලත් | වඩුපලයාගම, පොල්පිතිගම. | 720682648V |
| 33. | එස්.එම්. කුසුම්ලතා සමරකෝන් | හල්මිල්ලැව, කරඹෑ, මහව. | 906211491V |
| 34. | එච්.පී. සජිත් ප්‍රියාන් | මහකෝන්වැව, මහව. | 870801114V |
| 35. | ජේ.එම්.ඩී. ඇන් කුමාරිහාමිගේ | හාතිගමුව උතුර, පොල්පිතිගම. | 805294485V |
| 36. | එම්.පී. බුද්ධික විජේවර්ධන | තිඹිරිය ගෙදර, නාගොල්ලාගම. | 812534041V |
| 37. | සී. සාගර සඳරුවන් රණසිංහ | තැන්ගොඩවත්ත, කටුපොත | 872983660V |
| 38. | එල්.ඒ.ඩී. දිසානායක | ඉහළගම, කාඩිහාරය, බමුණාකොටුව. | 762792451V |
| 39. | ජේ.ඒ. වසන්තා ජයකොඩි | පොඩිරත්න අගමලේ මාවත, ලියනගම, මහව. | 767521316V |
| 40. | එම්. මහින්ද ප්‍රියශාන්ත | නල්ලූර, තුත්තිරිපිටිගම. | 892350515V |
| 41. | ආර්.බී. ගාමිණී දිසානායක | මොරගොඩ, පොල්පිතිගම. | 853523143V |
| 42. | එස්.කේ.බී.ආර්. රණසිංහ බණ්ඩාර | 283, බමුණුගම, නාගොල්ලාගම. | 763273938V |
| 43. | ඩී.ඒ.එම්. නන්දන බණ්ඩාර දිසානායක | ඉපල්ව, මාස්පොත. | 841152700V |
| 44. | ඩී.ආර්. කමල්සිරි ජයරත්න | දැතව, අඹන්පොල. | 752800260V |
| 45. | සී.ඒ.එච්.එම්. චන්ද්‍රසේකර | රටේ හිනුක්වැව, මහව. | 693052742V |
| 46. | ඩබ්.එම්. රංජිත් වන්නිනායක | 141, අබකොළවැව, අඹන්පොල. | 793122411V |
| 47. | එස්. සම්පත් බුද්ධික දේශප්‍රිය | 150, අබකොළවැව, අඹන්පොල. | 802615094V |
| 48. | ඩී.එම්. රංජිත් දිසානායක | බමුණුගම, නාගොල්ලාගම. | 751883501V |
| 49. | එච්.පී. අනුෂ පත්මකුමාර | හැලෝගම, නාගොල්ලාගම. | 861373967V |
| 50. | එෆ්.ඩී. අජිත් කුමාර දසනායක | තෙළඹියාව, නිකවැරටිය. | 771494269V |
| 51. | ඩී.එම්. විමල් | කදුරුවැව, පොල්පිතිගම. | 723443865V |
| 52. | පී.ආර්. නිරෝෂා මල්කාන්ති | මඩගල්ල, පොල්පිතිගම. | 735094033V |
| 53. | ඩබ්.ටී.එම්. සුමනාවතී | අමුණුගම, අඹන්පොල. | 706764054V |
| 54. | එල්.ඒ.ඩබ්.එම්. චමිලා කුමාරි අතපත්තු | හැලෝගම, නාගොල්ලාගම | 816152544V |
| 55. | ටී.ජී. අයෝමා සමන්තිනී | නිවාස 5 ඉදිරිපිට, හාතිගමුව. | 795804524V |
| 56. | ඒ.පී. සබීතා වීරසිංහ | වල්ගැස්ම. කනත්තේවැව. | 198153600869 |
| 57. | පී.එන්. අශෝක රත්නසේකර | පොතුවැපිටිය, කෝන්වැව. | 811442704V |
| 58. | ටී.එම්.සුජිත් ඒකනායක | හාතිගමුව, පොල්පිතිගම. | 672023920V |
| 59. | ඩබ්.එම්. ගාමිණී වීරසිංහ | නො.72, රජිතපුර, යාපහුව. | 742503232V |
| 60. | පී.පී. චන්දන සෙනරත් කුමාර දේශප්‍රිය | ඉහල මුදුගමුව, වෛද්‍ය සුනන්දාමාවත, මාළිය. | 893041455V |
| 61. | ආර්.එච්. සුජාත උපතිස්ස | “සරන කේටරින්” පහළවල කුඹුර, අලව්ව. | 713161683V |
| 62. | ආර්.ඒ. චිත්‍රා ස්වර්ණලතා | “ආසිරි”, හිනුක්වැව, මහව. | 707783672V |

02 - 267

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.